# 2013 – 10 – 08 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

| | | |
|---|---|---|
| **01.** | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 02. | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| **03.** | ඒ. පී. ලක්ෂමි හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| **04.** | එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **05.** | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 06. | පී. සරත් ශ්‍රීලාල් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **07.** | ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **08.** | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **09.** | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **11.** | කේ. එම්. චන්ද්‍රසිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **12.** | බී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. **09.45** ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ☸

**(01)**

## 01:01 2013 – 09 – 03 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2013 – 09 – 03 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව පිලිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්ලිව්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2013 – 08 – 06 දින සහ 2013 – 08 – 13 දිනට කල් තබන ලද මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**සංශෝධන 01**

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන**

2013 – 08 – 06 දින පැවති සභා වාර්තාවේ 38 වන පිටුවේ ගරු සභාපතිතුමා විසින් සභාව අඩාලව කල් තැබීමට පෙර තමා විසින් " මන්ත්‍රීවරුන්ට ආඥාපනත අනුව නියමිත කාලය තුල සභාවේ ගෙවීම් පිළිබඳ විස්තර ලබා දිය යුතු බවත් එසේ විස්තර ලබා නොදුන් ගෙවීම් සම්බන්ධයෙන් අප කණ්ඩායම විරුද්ධ වන බවත් " ප්‍රකාශ කල අතර එය සභා වාර්තාවට ඇතුලත් විය යුතු බව දන්වා සිටින ලදී.

තවද මේ අවස්ථාවේදී ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් ලේකම්වරයාගෙන් අදාල ගෙවීම් පිළිබඳව විමසනු ලදුව, අදාල ගෙවීම් පිළිබඳ වාර්තා නගර සභා ආඥා පනත සහ සභා රීති අනුව ලබා නොදී ඇති බැවින් ද ගරු නගර සභා මන්ත්‍රීවරුන්හට එම ගෙවීම් පිළිබඳව සලකා බැලීම සඳහා කාලය ලබා දිය යුතු බැවින් ද මෙම රැස්වීම 2013-08-13 දින සවස 2.30 ට කැඳවන බව ප්‍රකාශ කරමින් සභාව අඩාලව කල් තබන ලදී.

**(02)** සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන — නැත

**(03)** ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**3:1** " මාර්ග සංවර්ධන කටයුතු සඳහා අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් " මැයෙන් 2013- 09- 05 දාතමින් ගරු දකුණු පළාත් ආණ්ඩුකාරවර කුමාරි බාලසූරිය මැතිණිය විසින් එවන ලද ලිපිය සභාගත සභාගත කරන ලදී.

2013 වර්ෂයේ දෙවන භාගය සඳහා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් විසින් දන්වා එවා ඇති මිල ගණන්වල P- 33 සහ G - 10 අයිතමවල සංශෝධනයන් ඉදිරිපත් කරන අතර එම සංශෝධිත අයිතමයන් භාවිතයට ගන්නා ලෙස තාක්ෂණ නිලධාරීන් දැනුවත් කරන ලෙසත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

3.2 " තැපැල් බස්රථ තැපැල් කාර්යාල භූමියට ඇතුල්කිරීමේ අපහසුතාවය පිළිබඳව සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කිරීම " මැයෙන් අම්බලන්ගොඩ, ප්‍රධාන තැපැල් ස්ථානාධිපති විසින් එවා තිබූ වාර්තාව සභාගත කරන ලදී.

THW නිවාස සඳහා ඔප්පු ලබා දීමට එයට අදාලව ඉඩම් මැන රේඛා චිත්‍ර ලබා ගැනීම සඳහා මැනුම් ඉල්ලීමක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් යවා ඇති බවත් පොල්වත්තපුර නිවාස යෝජනා ක්‍රමය පවතින ඉඩමෙහි හිමිකම රජය සතුද යන්න නිශ්චිතවම තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු නොවීම මත ඉඩම

සඳහා පැවරුම් නියෝගයක් ලබා දීමේ කටයුතු කළ නොහැකිව තිබෙන අතර මේ පිළිබඳව ද/ප/ඉ/කො ගෙන් උපදෙස් ඉල්ලා ඇති අතර මේ තොරතුරු ලද වහාම ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මෙතන අපට නැති කොටස් දෙකයි තියෙන්නෙ. ඉතුරු කොටසේ පැවරුම් නියෝගය නගර සභාවට ලබා දීල නැහැ. ඒ ලිපිගොනුව සොයාගැනීමේ ප්‍රශ්නයක් තියෙනවා. ඒ නියෝගය ලැබුනට පස්සෙ තමයි අපට ඔප්පුවක් ලබාදීමේ බලය තියෙන්නෙ. රජයේ ඉඩම් පිළිබඳ අයිතිකරු දිසාපතිතුමා. මේක දිසාපතිතුමාගෙ කාලෙ අත්පත්කර ගත්ත ඉඩමක්. ගැසට් මගින් තමයි ඉඩම් අත්පත් කර ගන්නෙ. පැවරුම් නියෝගය ලබා දීමේ අයිතිය ප්‍රාදේශීය ලේකම්ට තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මෙතන ලබා දිය නොහැකි ඉඩම් කැබලි දෙකකුත් තියෙනවනෙ. ඒ කැබලි දෙක සම්බන්ධව අපි අත්පත් කර ගන්නවයි කියල යෝජනාවක් ගේන්න ඕනෙ නේද?

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

අපට කරන්න පුලුවන් අපේ දෙයක් සම්බන්ධයෙන් යම් විසඳුමක් දෙන්න. නගර සභාව මේක අරගෙන තියෙන්නෙ සුසානභූමිය සඳහා. මෙතන සුසාන භූමියෙන් කොටසක් පදිංචි කරුවන් වෙනුවෙන් අත්පත් කර ගන්න කියල යෝජනාව සම්මත කරල තමයි ඔය කාරණයට යන්න වෙන්නෙ. අපි කරන්නෙ මේ අනවසර පදිංචිකරුවන්ට නියමානුකූල කර ගැනීම සඳහා උදව්වක් පමණයි. අපේ නියම වගකීම නම් මේ අය ඉවත් කිරීම.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කතා කරමින්</u>**

මම අසල්වාසී ඉඩම්වල අය සමගත් මේ ගැන කතා කරා. මම හිතන විදියට ගිනිගේ කියන අයට අයිති එකක් මේක. ඒ අය පරිත්‍යාගයක් විදියට දෙන්න කැමතියි. එහෙම කරන්න ප්‍රමාණෙ කියන්න ඕනෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

මේකට හොඳම විසඳුම ප්‍රාදේශීය ලේකම්තුමා විසින් මේ කොටස අත්පත් කරගෙන ස්වර්ණ භූමි ඔප්පුවක් ලබා දෙන එක. මිනින්දොරු දෙපාර්තමේන්තුවේ අනුරේඛනය අනුව මේ ගෙවල් දෙක හැර අනික් කොටස නගර සභාවෙයි කියල පැහැදිලිව දීල තියෙනවා. ඒ දීපු කොටස අපිට නියමානුකූලව 44 වෙනි වගන්තිය යටතේ පැවරුම් නියෝගයකින් පවරල නැති එක විතරයි. දිසාපති සතු ඉඩම නගර සභාවට භාර දුන්නයි කියල ලියාපදිංචි කරන්න ඕනෙ. මේ ක්‍රියාදාමය රජයේ ආයතන වලින් බොහෝ විට කෙරෙන්නෙ නෑ. මේ දේවල් සොයල කරන්න ඕනෙ. මම දැනට සංවර්ධන සහකාර මහත්මියක් මේකට යොදවල තියෙන්නෙ පැහැදිලි ලෙස ඉඩම් ආඥා පනත යටතේ කටයුතු කරන්න කියලා. 10% දීපු ඉඩම් පවා අත්පත් කර ගැනීමට යන්න කියල තියෙන්නෙ.

**<u>තීරණය</u>**

☞ **ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඔප්පු ලබාදීම සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කිරීමටත් නගර සභාව සතු නොවන කොටස් දෙක සඳහා ද යෝජනාවක් ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට ඉදිරිපත් කිරීමටද සභාව තීරණය කරන ලදී .**

3.3 “ පෙර බදුකරුවන් විසින් නොගෙවන ලද කඩ කුලී සම්බන්ධව ” මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සභාගත කරන ලදී.

3.4 “ විහාරස්ථානයට ඉඩ ප්‍රමාණයක් ලබාගැනීම සඳහා ” මැයෙන් ඕකන්ද ශ්‍රී ජයබෝධි විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්න**

සේවය කරන ස්ථානය අවස්ථානුකූලව වෙනස් වේ.

7. තාවකාලික සේවකයින් කී දෙනෙකු සිටීද?
කිසිවකු නැත.

**පෙ. ව. 10.10 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

**(05)** යථා පරිදි කල්දී ඇති යෝජනා

**5:1 ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා** නැත

**5:2 නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

**5:2:1** අම්බලන්ගොඩ තානායම් භූමියේ හෝටල් සංකීර්ණයක් ඉදිකර පවත්වාගෙන යාම සඳහා යෝජිත බදු ගිවිසුමට 2013- 03- 01 දින පැවති මාසික සභාවේ අංක 1 : 1 යටතේ සභා අනුමැතිය ලද අතර නගර සභා ආඥා පනතේ අංක 36 ඉ (II) වගන්තිය අනුව අංක දපස/ප්‍රඅ/ පපා/ 2 හා 2013- 03- 13 දිනැති ලිපිය මගින් ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ ද අනුමැතිය ලැබී ඇත. එකී ගිවිසුමේ සංශෝධනයන් කිහිපයක් සිදුකිරීම

සඳහා 2013- 06- 04 දිනැති සභාවේ අංක 6:8 හා 2013- 08- 06 පැවති සභාවේ අංක 12: 17 යටතේ සභා තීරණය ගන්නා ලදී.

ඉහත සභා තීරණයන්ට අනුව සකස් කරන ලද අම්බලන්ගොඩ නගර සභාවත් ඇස්කොට් අම්බලන්ගොඩ පුද්ගලික සමාගමත් අතර තානායම් භූමිය බදු දීම සඳහා එළඹෙන සංශෝධිත බදු ගිවිසුම පිළිගැනීම සුදුසු බව මෙම සභාවට යෝජනා කර සිටින්නීය.

**මෙම යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි 15(ආ) වගන්තියේ තුන්වන පාර්ශවයක් ලෙස සැලකෙන්නේ කුමක්ද?

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

මෙයින් අදහස් වෙන්නෙ අපි බදු දුන්නට පස්සෙ තුන්වන පාර්ශවයක් කියන්නෙ උදාහරණයක් වශයෙන් නාගරික සංවර්ධන අධිකාරියට නගර සභාව සතු ඉඩම් පවරා ගන්න පුලුවන්. එවැනි අවස්ථාවකදි අපි මැදිහත් වෙලා බේරුම් කරනවයි කියන එක තමයි කියන්නෙ. මෙහිදී මතක තබා ගත යුතුයි අපේ පනත යටත් කරල තියෙනවා නාගරික සංවර්ධන අධිකාරියේ පනතට. ඒ අනුව මේ අපි ඉන්න ගොඩනැගිල්ලත් නාගරික සංවර්ධන අධිකාරියට පවර ගන්න පුලුවන්. එවැනි අවස්ථාවකදි අපි මැදිහත් වෙලා බේරල දෙනවයි කියන එකයි කියන්නෙ. අපි ඒ වගකීම ගන්න ඕනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්**

සභාපතිතුමනි පවර ගැනීමක් කරොත් කරන්නෙ රජයෙන්නෙ. පුද්ගලික අංශයෙන් නෙමෙයිනෙ. නගර සභාව කියන්නෙත් රජයනෙ. අපි ගිවිසුමකින් දෙනව අපි මැදිහත් වෙනවයි කියල හානි පූරණයට. මේකෙ බේරුම්කරුවෙකු පත් කරල තියෙනවනෙ. ඒගොල්ලො දෙපැත්තටම සාධාරණව තීන්දුව දුන්නට පස්සෙ රජය ඒක ගෙවන්න ඕනෙ. මේ මහා පරිමාණ ගිවිසුම්වල මේ තත්වය තියෙනව සභාපතිතුමනි. නැත්තම් ආයෝජකයන් එන්නෑ. ඒ අය මේවගෙ ආයෝජනය කරල රජය කිව්වොත් එහෙම පැය 24 න් අත්පත් කර ගන්නවයි කියල ඒ අයට අත පිහිද ගන්න වෙනවා. එහෙම දේකට කැමති වෙන්නෑ ආයෝජකයො. එතකොට මේක කවදාවත් කාටවත් දී ගන්න බැරි වෙනවා.

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

තුන්වන පාර්ශවය කියන්නෙ වෙනත් කවුරුහරි ඇවිල්ල මේ දේපල වලට හානි කරොත් ඒක තුන්වන පාර්ශවයක් වෙනවනෙ. මම මේ අහන්නෙ දැනගන්නයි. විරුද්ධ වීමක් නෙමෙයි.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

“ මෙම පරිශ්‍රයේ අයිතිය හා නිරවුල් භුක්තිය ” සම්බන්ධයෙන් විතරයි මේ කතා කරන්නෙ. 15(ආ) වගන්තියේ ඒක පැහැදිලිව තියෙනවා.

**මෙම යෝජනාව සඳහා වෙන් වෙන් වශයෙන් ඡන්දය විමසනු ලදුව යෝජනාවට පක්ෂව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජී. ඩබ්. ජගත් කුමාර මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අය ඡන්දය ප්‍රකාශ කල අතර විපක්ෂව එක් ඡන්දයක්වත් නොලැබුණි. ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

<u>තීරණය</u>

☞ **අම්බලන්ගොඩ නගර සභාවත් ඇස්කොට් අම්බලන්ගොඩ පුද්ගලික සමාගමත් අතර තානායම් භූමිය බදු දීම සඳහා එළඹෙන සංශෝධිත බදු ගිවිසුම පිළිගැනීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.**

**05:2:2** පහත විස්තර කරනු ලබන ඉඩම දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩපත්තුව උතුර, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 86E ඕකන්ද ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. එම්. ද සිල්වා මහතා විසින් 2008- 11- 14 දින මැන පිළියෙල කරන ලද අංක 950 දරණ පිඹුරේ නිරූපිත

ඉහතකී අම්බලන්ගොඩ පොල්වත්ත ගමේ පිහිටි හෙරලියගහගොඩැල්ල නැමති ඉඩමේ අංක 78 දරණ ඉඩම් කැබැල්ල නම් වූ

| | | |
|---|---|---|
| උතුරට | :- | කැබලි අංක 81 පාර |
| නැගෙනහිරට | :- | කැබලි අංක 81 පාර සහ කැබලි අංක 77 |
| දකුණට | :- | කැබලි අංක 74 |
| බස්නාහිරට | :- | කැබලි අංක 79 යන |

මායිම් තුල පිහිටි පර්. 14.37 ක් වන ඉඩම් කැබැල්ල ගංගේ කුලතුංග ද සිල්වා යන අයට පවරා දීමට යෝජනා කර සිටිමි.

**මෙම යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**මෙම යෝජනාව සඳහා ඡන්දය විමසනු ලදුව යෝජනාවට පක්ෂව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා, ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අය ඡන්දය ප්‍රකාශ කල අතර විපක්ෂව එක් ඡන්දයක්වත් ප්‍රකාශ නොකල අතර ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා යන අය ඡන්දය දීමෙන් වැලකී සිටින ලදී. ඒ අනුව එම යෝජනාව සභා සම්මත විය.**

<u>තීරණය</u>

☞ **2008- 11- 14 දින මැන පිළියෙල කරන ලද අංක 950 දරණ පිඹුරේ නිරූපිත අම්බලන්ගොඩ පොල්වත්ත ගමේ පිහිටි හෙරලියගහගොඩැල්ල නැමති ඉඩමේ අංක 78 දරණ ඉඩම් කැබැල්ල ගංගේ කුලතුංග ද සිල්වා යන අයට පවරා දීමට සුදුසු බවට සභාව තීරණය කරන ලදී.**

**05:2:3** පහත විස්තර කරනු ලබන ඉඩම දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩපත්තුව උතුර, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 86E ඕකන්ද ග්‍රාම නිලධාරී වසමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. එම්. ද සිල්වා මහතා විසින් 2008- 11- 14 දින මැන පිළියෙල කරන ලද අංක 950 දරණ පිඹුරේ නිරූපිත

ඉහතකී අම්බලන්ගොඩ පොල්වත්ත ගමේ පිහිටි හෙරලියගහගොඩැල්ල නැමති ඉඩමේ අංක 74 දරණ ඉඩම් කැබැල්ල නම් වූ

| | | |
|---|---|---|
| උතුරට | :- | කැබලි අංක 76, 77, 78 හා 79 |
| නැගෙනහිරට | :- | කැබලි අංක 75, 76, 77 |
| දකුණට | :- | කැබලි අංක 75, 73 |
| බස්නාහිරට | :- | කැබලි අංක 81 පාර සහ අංක 80 යන |

මායිම් තුල පිහිටි පර්. 14 ක් වන ඉඩම් කැබැල්ල වැදිසිංහ ආරච්චිගේ සෝමසිරි යන අයට පවරා දීමට යෝජනා කර සිටිමි.

**මෙම යෝජනාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.**

**මෙම යෝජනාව සඳහා ඡන්දය විමසනු ලදුව යෝජනාවට පක්ෂව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා, ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අය ඡන්දය ප්‍රකාශ කල අතර විපක්ෂව එක් ඡන්දයක්වත් ප්‍රකාශ නොකල අතර ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා යන අය ඡන්දය දීමෙන් වැලකී සිටින ලදී. ඒ අනුව එම යෝජනාව සභා සම්මත විය.**

තීරණය

☞ **2008- 11- 14 දින මැන පිළියෙල කරන ලද අංක 950 දරණ පිඹුරේ නිරූපිත අම්බලන්ගොඩ පොල්වත්ත ගමේ පිහිටි හෙරලියගහගොඩැල්ල නැමති ඉඩමේ අංක 74 දරණ ඉඩම් කැබැල්ල වැදිසිංහ ආරච්චිගේ සෝමසිරි යන අයට පවරා දීමට සුදුසු බවට සභාව තීරණය කරන ලදී.**

- **පෙ. ව. 10.30 ට පමණ ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා මුලාසනයෙන් ඉවත්ව ගිය බැවින් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා මුලාසනයේ අසුන් ගන්නා ලදී.**

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2013- 08- 15** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**අම්බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති තුමා මුලාසනය දැරූ 2013/08/15 දින පුස්තකාල කමිටු වාර්තාවයි.**

| | |
|---|---|
| ■ ඩී.වී. සුනිල් මහතා | (ලේකම්, නගර සභාව) |
| ■ කේ.එච්. මෙලානි මධුෂා මිය | (පුස්තකාලයාධිපතිනි) |
| ■ ටී. නදීකා නිල්මිණි මෙනවිය | (සංවර්ධන නිලධාරි) |
| ■ ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා | (කමිටු සාමාජික) |
| ■ එන්.එච්. ඩන්කන් ද සිල්වා මහතා | (කමිටු සාමාජික) |
| ■ සිරිපාල මාදුවගේ මහතා | (කමිටු සාමාජික) |
| ■ හර්බට් වීරක්කොඩි මහතා | (කමිටු සාමාජික) |
| ■ සුගත් හෙට්ටි ආරච්චි මහතා | (කමිටු සාමාජික) |
| ■ පී.ඩබ්. ගුණසිරි මහතා | (කමිටු සාමාජික) |
| ■ ටී.ඩබ්. හරිශ්චන්ද්‍ර මහතා | (කමිටු සාමාජික) |
| ■ ජේ.ඩබ්.ජේ. සිල්වා මහතා | (කමිටු සාමාජික) |
| ■ ටී.ඩබ්. පියසිරි මහතා | (කමිටු සාමාජික) |
| ■ පී.එච්.එල්. පියන්ති මෙනවිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ඒ.ඩබ්. ඉන්ද්‍රදාස මහතා | (පුස්තකාල සාහායක) |
| ■ ගෞරි වර්සවිතාන මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ එම්.ඩබ්.ජේ. සුමංගලී මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ ඒ.ජී. රසිකා මිය | (පුස්තකාල සාහායිකා) |
| ■ එස්.එම්. මනෝරි චන්ද්‍රවංශ මිය | (පුස්තකාල සාහායිකා) |

■ කේ.ඒ. විසුද්ධි රේණුකා මිය (පුස්තකාල සාහායිකා)

■ ඒ.පී. ලක්ෂ්මී පෙරේරා මෙනවිය (පුස්තකාල සාහායිකා)

ගරු සභාපතිතුමා කමිටුවට පැමිණි මහත්ම මහත්මීන් පිළිගැනිමෙන් පසු එදින පෙ.ව 10.30 ට සභාවේ වැඩ ආරම්භ කළේය.

■ **පුස්තකාල ප්‍රගති වාර්තා කමිටුවට ඉදිරිපත් කිරීම පළමුව සිදුවිය.**

ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපති කේ.එච්. මෙලානි මදුෂා මහත්මිය විසින් ද, අනෙකුත් ශාඛා පුස්තකාලවල ප්‍රගති වාර්තා ඒ ඒ ශාඛා භාර නිලධාරීන් විසින් ද, ඉදිරිපත් කරන ලදි. ඕකන්ද ශාඛා පුස්තකාලයේ සාහායිකාව නොපැමිණීම හේතුවෙන් එම වාර්තාව ඒ.ඩබ්. ඉන්දදාස මයා විසින් ඉදිරිපත් කරන ලදි.

■ පොත් නිකුත් කිරීමේ ප්‍රස්ථාරය අනුව හිරේවත්ත, හෙප්පුමුල්ල, පෝරඹ යන ශාඛා පුස්තකාලවල ප්‍රගතියක් දැකගැනීමට නොහැකි බැවින් එයට සුදුසු ක්‍රියා මාර්ගයක් ගෙන දියුණු තත්වයට පත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් පුස්තකාලයාධිපතිනිය දැනුවත් කරන ලදි.

<u>**වෙනත් කරුණු:-**</u>

ප්‍රධාන පුස්තකාලය හා සමහර ශාඛා පුස්තකාල තුළ අපිරිසිදු බවත් කමිටු සාමාජික ඩන්කන් මහතා පැවසුවේය. ගෞරි මහත්මිය කියා සිටියේ අපේ ශාඛා පුස්තකාල අපිම පිරිසිදු කර ගන්නා බවයි. ගරු සභාපතිතුමා කියා සිටියේ පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් ම තම තමන්ගේ පුස්තකාල පිරිසිදු කර ගන්නා ලෙසයි. එයට වෙනත් සේවකයින් යෙදවීම අනවශ්‍ය බව සභාපතිතුමා කීවේය.

■ පොත් බැඳීම සඳහා අවශ්‍ය මුදල් සභාවෙන් ලබාදෙන රු.5000/= මුදලින් එම අවශ්‍යතා සපුරා ගන්නා ලෙසට ගරු සභාපතිතුමා කරුණු දක්වන ලදි. පුස්තකාල සේවා මණ්ඩලයේ පොත් බැඳීමේ පාඨමාලාව සඳහා පුස්තකාල සේවකයින් යවා පුහුණුව ලබාදෙන ලෙස සභාපතිතුමා විසින් ලේකම් මහතාට උපදෙස් දුන්නේය.

■ ගරු සභාපතිතුමා කියවීම මාසයේ උත්සවය සඳහා අනුග්‍රහය දක්වන රාජ්‍ය ආයතන, තරඟ, සහතිකපත්, ත්‍යාග ගැන පුස්තකාලාධිපතිනියගෙන් විමසුවේය. ප්‍රධාන දේශක තුමාට මහජන බැංකුව අනුග්‍රහය දක්වන බවත් තරඟ සැප්තැම්බර් මාසයේ පවත්වන බවත් එහිදී පුස්තකාලයාධිපතිනිය කරුණු දැක්වුවාය. විද්‍යුත් පුස්තකාලයට අවශ්‍ය ලී බඩු, පරිගණක හා සියළුම අඩුපාඩු සකසා ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් පුස්තකාලයාධිපතිනිය දැනුවත් කරන ලදී.

■ කියවීම් මාසයේ උත්සවයට ඔක්තොම්බර් 15 දින ප්‍රධාන අමාත්‍යතුමාද සංස්කෘතික ඇමති ටී.බී. ඒකනායක මහතා ද විද්‍යුත් පුස්තකාලය විවෘත කිරීමට පැමිණෙන බවත්, කියවීම් මාසයේ උත්සව කටයුතු වලට පළමුව එය විවෘත කිරීමට කටයුතු කරන ලෙසත් සභාපතිතුමා විසින් පුස්තකාලයාධිපතිනිය දැනුවත් කළේය. පුස්තකාල සේවා මණ්ඩලයේ නිලධාරීන්ද ගෙන්වීම මැනවයි ගරු සභාපතිතුමා කියා සිටියෙන් කමිටු සාමාජික ජිනේන්ද්‍රවංශ මහතා යෝජනා කළේ පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති මහාචාර්ය සෝමරත්න බාලසූරිය මහත්මා ගෙන්වා ගැනීමට කටයුතු කරන්නේ නම් යෝගය බවයි. මාධ්‍ය ආයතන දැනුවත් කරන ලෙසද කමිටු සාමාජික සුගත් හෙට්ටි ආරච්චි මහතා පැවසීය. රූපවාහිනි හා පුවත්පත් මගින් ඔක්තොම්බර් පැවැත්වෙන මෙම උත්සවය ගැන මහජනතාව දැනුවත් කිරීම කරන ලෙසත් ජිනේන්ද්‍රවංශ මහතා පැවසීය.

■ ප්‍රධාන පුස්තකාලයේ සේවය කොට විශ්‍රාම ගිය පුස්තකාලයාධිපතිවරුන්ට මෙම උත්සවයට ආරාධනා කරන ලෙසත් සුගත් හෙට්ටිආරච්චි මහතා පැවසීය. එහිදී ගරු සභාපතිතුමා වැඩි දුරටත් කියා සිටියේ පුස්තකාලයාධිපතිනිය එය ඉටු කරන බවයි. එහිදී සභාපතිතුමා වැඩි දුරටත් කියා සිටියේ ආරාධිත අමුත්තන් සඳහා දිවා ආහාරය සපයන ලෙසත් පුස්තකාලයාධිපතිනියට උපදෙස් දෙන ලදි. ගිය වසරේ

උත්සවය දින ජයග්‍රාහකයනට සහතිකපත් බෙදා දීම පමා වු බවත් ආරාධිත අමුත්තන් පැමිණෙන අවස්ථාවේ පවා පිළිගැනීමේ තොරණ වැඩ නිම නොකර තිබු බවත් ධන්කන් මහතා පැවසීය. මේ වසරේ සියළු වැඩ කටයුතු මනා ලෙස ඉටු කිරීමට ඒ ඒ කාර්‍යයන්ට සේවකයින් යොදාගෙන එම කටයුතු නිසි ලෙස සපුරා ගන්නා ලෙසත් සභාපතිතුමා පුස්තකාලයාධිපතිතුමිය දැනුවත් කළේය. ජාතික කියවීමේ මාසය, අම්බලන්ගොඩ නගර සභාව ආදී ගිය වසරේ මෙන් ලාංඡනයක් නිර්මාණය කොට එම අවස්ථාවට සහභාගී වන සියලු දෙනාටම පැළඳීමට කටයුතු කරන ලෙස සභාපතිතුමා පුස්තකාලයාධිපතිනිය දැනුවත් කළේය.

- කියවීමේ මාසයේ උත්සවය සඳහා වේදිකාව සැරසීමේදී අම්බලන්ගොඩ අනන්‍යතාවය පිළිඹිබු වන පරිදි ටී.ඩබ්. හරිශ්චන්ද මහතාගේ වෙස් මුහුණු වේදිකාවේ පැත්තක ප්‍රදර්ශනය කිරීමට කටයුතු සැලැස්වීමට හැකිනම් එය වඩාත් අර්ථදායී වන බව හර්බට් වීරක්කොඩි මහතා පැවසීය. එම අදහසට සියළු කමිටු සාමාජික මහතුන් එකඟතාවය පළ කළේය.
- පුස්තකාලයේ මෙම තරඟාවලියේ අවස්ථා අන්තර්ජාලයට යොමු කරන ලෙසත් කමිටු සාමාජික මහතුන් පැවසු අතර එම අවශ්‍යතා සැපිරීම නිසා විශේෂ ප්‍රසිද්ධියක් මෙන්ම අප නගර සභාවට කීර්තියක් ද, ලැබෙන බවත් සභාපතිතුමා විසින් පෙන්වා දෙන ලදී. සියළුම ව්‍යාපාර ආයතන වලින් මෙම උත්සවය සඳහා මුදල් ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් ගරු සභාපතිතුමා විසින් පුස්තකාලයාධිපතිනිය දැනුවත් කරන ලදී. පක්ෂ භේදයකින් තොරව හිටපු නගරාධිපතිවරු හා නාගරික මන්ත්‍රීවරුන්ට ආරාධනා කළයුතු බවත් කමිටු සාමාජික ධන්කන් මහතා පැවසීය. මෙම කමිටු රැස්වීමට විරුද්ධ පක්ෂවල හෝ ආණ්ඩු පක්ෂයේ නාගරික මන්ත්‍රීවරුන් සහභාගී නොවන්නේ ඇයි දැයි තව දුරටත් ධන්කන් මහතා කමිටුවේදී විමසන ලදී.
- නර්තන කාණ්ඩායම් සඳහා විදුහල්පතිවරුන් සමඟ සාකච්ඡා කොට එය ඉටුකරගන්නා ලෙසත්, සමස්ත ලංකා පළමු ස්ථානය ලබාගත් ප්‍රජාපති ගෝතමී විද්‍යාලයේ නැටුම් කණ්ඩායම ලබා ගන්නා ලෙස කමිටු සාමාජික හර්බට් වීරක්කොඩි මහතා ඉල්ලා සිටියේය.
- පොත් පරිගණක ගත කිරීමේදී එය ඉක්මනින් පරිගණක ගත කිරීමට සුදුසු පියවරක් ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් ප්‍රජාසංවර්ධන නිලධාරිනියට උපදෙස් දෙන ලදී.
- කියවීම් මාසයේ සහතික ලබා දීමේදී සහතික පත්‍රය දැමීම සඳහා පයිල් කවරයක් මුද්‍රණය කොට ත්‍යාග හා සහතිකපත් ලබාදීමේදී පිළිවෙලට එම කටයුත්ත නිසියාකාරව ඉටුකරන ලෙසත් ගරු සභාපතිතුමා පුස්තකාලයාධිපතිනිය දැනුවත් කළේය.
- ජංගම දුරකථන භාවිතයේදී පාඨක පිරිසට අවහිර නොවන පරිදි පුස්තකාලයෙන් පිටතට ගොස් එය භාවිතා කරන ලෙස මහජනතාව දැනුවත් කරන ලෙස පුස්තකාලයාධිපතිනියට උපදෙස් දුන්නේය. සුගත් හෙට්ටිආරච්චි මහතාගේ ඉල්ලීම පරිදි කියවීම් අංශයේ පාඨක පිරිසට වන හිරිහැරය මෙයින් අඩු කරගැනීමට හැකිබවද කමිටු සාමාජික මහතුන්ගේ තීරණය විය.
- ජාතික කියවිම මාසය සඳහා මනෝරි මහත්මිය විසින් තරඟ, විනිශ්චය මණ්ඩලය, ත්‍යාග, තරඟවල ඇස්තමේන්තුවක් එම පුස්තකාලයේ අවට පාඨක පිරිසගෙන් උදව් ඇතිව නගර සභාව මඟින් කිසිදු මුදලක් වැය නොකර ඇය විසින්ම සංග්‍රහ කටයුතු සඳහාද එම කාර්‍යයට කමිටු සාමාජික ටී.ඩබ්. පියසිරි මහතාද සහභාගීවන බවත් පැවසුවාය.

පුස්තකාල තෝරා ගැනීමේ තරඟයට මහඅම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ වාර්තාවද, ඡායාරූපද ඇතුලත්ව ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට මෙම තරඟ ආදී විස්තර යවන ලෙස පුස්තකාලයාධිපතිනිය දැනුවත් කරන ලදි. ගරු සභාපතිතුමා කියා සිටියේ මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ එම වැඩ පිළිවෙල ගැන ඉතා සතුටට පත්වන බවයි. අනෙක් ශාඛා පුස්තකාල සහායිකාවන්ද එම ක්‍රමවේදය භාවිතා කොට ආදර්ශමත් වැඩ පිළිවෙලක් සපුරන ලෙසයි.

- හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලයට ගෞරි මහත්මිය බිම සිටුවන විදුලි පංකාවක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදි. එය ලබා දෙන ලෙස පුස්තකාලයාධිපතිනියට උපදෙස් දෙන ලදි. මහ අම්බලන්ගොඩ

වැඩි පාඨක පිරිසක් සන්ඩේ අයිලන්ඩ් පුවත්පත නොකියවන හෙයින් පුස්තකාලයට සන්ඩේ ටයිම්ස් පුවත්පත ලබාදීම සුදුසු බව පාඨක අදහස් පොත බැලීමෙන් පසු සභාපතිතුමා ගත් තීරණයට කමිටුවේ කැමැත්ත ප්‍රකාශ විය.

පාඨක අදහස් පොතේ ගමේ අඩුපාඩු හා පුස්තකාලවල අඩුපාඩුත් පාඨකයින්ට කියා ලියා ගන්නා ලෙස ගරු සභාපතිතුමා පුස්තකාල සාහායිකාවන්ට උපදෙස් දෙන ලදි. අනෙක් ශාඛා පුස්තකාල පාඨක පොත්හි සඳහන් කර ඇති පොත් ද එම ශාඛා පුස්තකාල වලට ලබා දීමට කටයුතු කරන ලෙස සභාපතිතුමා විසින් පුස්තකාලයාධිපතිනියට උපදෙස් දෙන ලදි.

කමිටු වාර්තා පිටපත් ගැනිමේදී කොළ නාස්ති නොකර එක කොළයේ දෙපැත්ත ප්‍රයෝජනයට ගන්නා ලෙස කමිටු සාමාජික ඩන්කන් මහතා ප්‍රකාශ කළේය.

වෙනත් කරුණු ඉදිරිපත් නොවු බැවින් ගරු සභාපතිතුමා ස්තුති කතාව සඳහා ලේකම් මහතාට ආරාධනා කළේය. එහිදි එතුමා ස්වේඡාවෙන් කමිටුවට පැමිණි කමිටු සාමාජික මහතුන්, පුස්තකාලයාධිපතිනිය හා පුස්තකාල කාර්ය මණ්ඩලයට ස්තුතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ අවසන් කළේය.

.........................................
කමිටු ලේකම්,
නගර සභාව අම්බලන්ගොඩ.

| | |
|---|---|
| ......................................... | ................................................ |
| ලේකම්, | අත්සන් කළේ සභාපති, |
| නගර සභාව අම්බලන්ගොඩ. | නගර සභාව අම්බලන්ගොඩ. |

**ඒ අනුව 2013 -08- 15 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2013- 08- 27** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පරිසර සෞඛ්‍ය හා සනිපාරක්ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රි ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.

**<u>පරිසර සෞඛ්‍ය හා සනීපාරක්ෂක කමිටුව</u>**

**<u>2013.08.27 ප.ව. 2.30</u>**

**<u>සහභාගීත්වය</u>**

| | |
|---|---|
| ❖ ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා | සභාපති, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ වෛද්‍ය ටී ප්‍රණීත් මහතා. | සහකාර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී අම්බලන්ගොඩ, |
| ❖ ඩී වී සුනිල් මහතා | ලේකම්, අම්බලන්ගොඩ නගර සභාව. |
| ❖ පී.එස් චන්ද්‍රජිත් මහතා. | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ප්‍රා.ලේ.කාර්යාලය |
| ❖ පී. එච්. එල් සී පුෂ්පරාණි මහත්මිය | සංවර්ධන සහකාර, අම්බලන්ගොඩ නගර සභාව, |
| ❖ එල් එච්.බී මංජුල මහතා. | ම. සෞ. පරීක්‍ෂක බරවා රෝග මර්ධන |
| ❖ පී. එස්. එස්. ද සිල්වා මහතා. | ම. සෞ. පරීක්‍ෂක, අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ ඩබ්.එන්.අයි මෙන්ඩිස් මහතා. | ම.සෞ.පරීක්ෂක. අම්බලන්ගොඩ නගර සභාව |
| ❖ කේ ශාන්ති මහත්මිය | ගොවිජන සංවර්ධන නිලධාරී. අම්බලන්ගොඩ. |
| ❖ ඩී.එස්.ඊ ගමගේ මිය. | ප.සෞ.සේ නිලධාරී |

- ❖ බී.ඩී.ඊ කොඩිතුවක්කු මිය. ප.සෞ..සේ නිලධාරී
- ❖ එම්.ඩබ් හිරාන් සංජීව මහතා සෞඛ්‍ය පරිපාලක

**පිළිගැනිම :- ගරු සභාපති ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා.**
සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කමිටුව සඳහා පැමිණි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තුමා ඇතුළු සියළු නිලධාරි මහත්ම මහත්මීන් හා අනෙකුත් සියළුම රජයේ නිලධාරිනුත්, නගර සභා කාර්‍ය මණ්ඩලයත් ඉතාමත් ගෞරවයෙන් පිළිගනු ලබන බව පවසන ලදි. ඉන් අනතුරුව එළඹියේ පසුගිය රැස්වීමේ සාකච්ඡා වු කරුණු සමාලෝචනයක යෙදීමයි.

❖ **ගලි බවුසරයේ සේවය නිසි පරිදි ලබා දිමට නොහැකි වීම**

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**
ගලි බවුසරයේ සේවය ලබා ගැනිමට පැමිනෙන පෞද්ගලික හා රජයේ ආයතන සියළුම දෙනා තම අවශ්‍යතාව ඉතා කඩිනමින් ඉටු කර ගැනිමට බලාපොරොත්තු වෙනවා. ඒ අයගේ අවශ්‍යතාව හැකි ඉක්මණින් ඉටු කිරිමට අපි බැඳී සිටිනවා .මේ සඳහා හොඳම විසඳුම නව සේවකයෙක් බඳවා ගැනීමයි. එහෙත් මේ සඳහා වඩාත්ම ගැලපෙන යෝජනාව ම.සෞ.පරික්ෂක මහතුන්ට ඉදිරිපත් කරන ලෙස පවසන ලදි.

**ම.සෞ.පරීක්ෂක පී. එස්. එස්. ද සිල්වා මහතා**

ජූලි මාසය තුළ ලෝඩ් 39 ලැබී ඇති අතර නිතරම ලෝඩ් පහක හයක පමණ ප්‍රමාණයක් පොරොත්තු ලේඛනයේ හින්නවා. එහෙත් මේ වෙනුවෙන් අමතර සේවකයෙක් යොදා ගැනීම එතරම් සුදුසු නැහැ. දිනකට හික්කඩුවට භාර ගන්නේ එක ලෝඩ් එකයි. ඒ නිසා මේ ආකාරයටම තව ටික කාලයක් සිදු කිරිම සුදුසුයි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**
පෞද්ගලික ස්ථානවල සේවය ඉක්මණින් ලබා දුන්නද, රජයේ ආයතනවලට එම සේවය ලබා දීම ඉතාම ප්‍රමාද වන බව නිතරම මා වෙත පැමිණිලි ලැබෙනවා.

**තීරණය :-ගලි බවුසරය සඳහා වන වියදම් ඉන්ධන, ණය වාරිකය, දිරි දීමනා, යනාදී වියදම් වෙන්වෙන් වශයෙන් සකස් කර මාසික සභාවට වාර්තාවක් ලබා දීම. හා එමගින් නව සේවකයකු යොදවා ගැනීමට ඇති හැකියාව පිළබඳ සොයා බැලීම.**

❖ **සෞඛ්‍ය අංශයේ අතිකාල ලබා දීමේදී ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා නොකිරීම**

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**
වටරවුම අසල සිට මාදම්පා පාලම දක්වා, දුම්රිය පොල පාර, පුංචි පොල පාර පරණ ස.තො.ස පාර, ආදී මාර්ගවල රාත්‍රී කාලයේදී තමාට හිමි කොටස සම්පූර්ණයෙන් අවසන් කළ පසු අතිකාල ලබා ගත හැක මේ පිළිබඳව ඔවුන් දැනුවත් කර ඇති අතර සභා තීරණයක් ද ගෙන ඇත. එබැවින් රාත්‍රී කාලයේදි අතිකාල සේවයේ යෙදෙන අයට පමණක් මෙය අදාළ වේ.

❖ **පටබැඳිමුල්ල සායන මධ්‍යස්ථානයට යාබද ඉඩම වල් බිහි වී තිබීම හා පොල් ගස කපා ඉවත් කිරිම.**

ආයුර්වේද ගාඩ්න් ආයතනය දැනට පිරිසිදු කරනුයේ ජීවන් කසුතුරිආරච්චි මහතා තම පෞද්ගලික වියදමිනුයි.

**තීරණය :- ආයුර්වේද ගාඩ්න් ආයතනය ගිවිසුම්ගත වී ඇති පරිදි අදාළ පිරිසිදු කිරීමේ කටයුතු සිදු නොකරන්නේ නම් ගිවිසුම අවලංගු කරන බව දැනුම් දිම.**

❖ **හල්වතුර අවසන් බැහැරලන ස්ථානය අවට නිවැසියන්ට මැස්සන්ගෙන් සිදුවන අපහසුතාව**

**ම.සෞ.පරීක්ෂක පී. එස්. එස්. ද සිල්වා මහතා**

එම ස්ථානයේ මැස්සන්ට ඉසිම සඳහා අවශ්‍ය බෙහෙත් ගෙනැවිත් ඇති බැවින් ඉතා කඩිනමින් එම බෙහෙත් ඉසින බව පවසන ලදි.

❖ **පළාත් පාලන සතිය නිමිත්තෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහ**

පලාත් පාලන සතිය වෙනුවෙන් සකස් කරන ලද වැඩසටහනේ සෞඛය හා සනීපාරක්ෂක දිනය වෙනුවෙන් ගාල්ල බන්ධනාගාරයේ රැඳවියන් 200 ක් හා ගලි බවුසරය යොදා ගෙන නගරයේ කාණු පවිත්‍ර කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමටසැලසුම් කර ඇති බව පී.එච් එල් සී පුෂ්පරාණි මහත්මිය කමිටුව දැනුවත් කරන ලදි

**ලැබී ඇති ලිපි සභාවට ඉදිරිපත් කිරීම.**

පී.එස්.එස් ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරන ලද කසල අවසන් බැහැරලන ස්ථානයට ප්‍රවේශ මාර්ගය සකස් කර දෙන ලෙස කරන ලද ඉල්ලිම.

**තීරණය :- මේ පිළිබඳව වැඩ අධිකාරී ලවා ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙස සභාපති තුමා දන්වන ලදි.**

සෞඛ්‍ය පරිපාලක ඒ.ඒ.කේ රණවික්‍රම මහතා විසින් ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය අංශයේ සේවකයන්ගේ අඩුපාඩු කිහිපයක් සම්පූර්ණ කරන දෙන ලෙස ඉල්ලීම් ලිපිය.

**තීරණය :- ලිපියේ සඳහන් ද්‍රව්‍ය ලබා දෙන ලෙස දන්වන ලදි.**

**ම.සෞ.පරීක්ෂක පී. එස්. එස්. ද සිල්වා මහතා**

සෙනෙක්වින් ආයතනය මගින් පරිසර බලපත්‍රය අළුත් කිරීම සඳහා යොමු කරන ලද අයදුම්පත පසුගිය දින පැවති තාක්ෂණික කමිටුවේ දි ප්‍රතික්ශේප කළ බවත් එම ස්ථානයෙන් බැහැරලන ඉඳුල් හා අප ජලය උරා ගැනීම සඳහා වලක් සකස් කරන ලෙසත් දන්වා යවන ලදි. එම කාර්‍ය ඉටු වී ඇත්ද යන්න පරික්ෂා කිරිම සඳහා මෙන්ඩිස් මහතා සමග තමා ද ගිය බවත් තව දුරටත් එම ස්ථානයේ කාණුව තුළින් ඉඳුල් ගලා යාම සිදුවන බවත් ප්‍රකාශ කරන ලදි. මේ සම්බන්ධව ව්‍යාපාරික ස්ථානය අයිතිකරුගේ පුතාට දැනුම් දුන් බවත් ඉඳුල් තැන්පත් විම සඳහා පිරිපහදු ඒකකයක් සකස් කිරිමට ඔහු පොරොන්දු වූ බවත් ප්‍රකාශ කරන ලදි. කර්මාන්ත ස්ථානගත කිරිමේදී මෙවැනි ක්‍රියා මාර්ග ගත්තේ නම් මේ ආකාරයේ ගැටළු පැන නොනගිනු ඇත.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා .**
අරලිය හෝටලයේ මෙවැනි ප්‍රශ්නයක් මතු විම නිසා ඔවුනට විරුද්ධව නඩු පැවරිමට හා එම ව්‍යාපාරික ස්ථානය එතැනින් ඉවත් කිරිමට පවා සිදු වුණා.

**තීරණය : - ඒ පිළිබඳ අදාළ ව්‍යාපාරික ස්ථානය දැනුවත් කිරීමට තීරණය කරන ලදි.**
**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා .**
ම.සෞ.පරීක්ෂක මහතුන් සඳහා කණ්ඩලමේ පිහිටි හෝටලයේ අපජලය පිරිපහදු කිරිමේ ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යනය කිරිම සඳහා ක්ශේත්‍ර චාරිකාවක් රාජ්‍ය නොවන සංවිධානයක සහාය ඇතිව හෝ සභා අරමුදල් යටතේ ලබා දිය හැකි බවත් පවසන ලදි.

**ම.සෞ.පරීක්ෂක පී. එස්. එස්. ද සිල්වා මහතා**

සෞඛ්‍ය අංශයේ සේවකයන් සඳහා පිටගැස්ම එන්නත හා පණු බෙහෙත් ලබා දිය හැකි බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා .**
එය ඉතා හොඳ කාර්යක් බවත්, එක වරකට දහ දෙකනුට පමණ එන්නත ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදි. ප.සෞ.සේවා නිලධාරීන්ගේ මාසික වාර්තා ලැබීමේ ප්‍රමාදයක් පවතින බවත් එම වාර්තා මාසික සභාවේ සභාගත වන නිසා වසර ගණනාවක් ගත වුව ද එම තොරතුරු පවතින බැවින් පාසල්වලට දරුවන් ඇතුළත් කිරිමේ දී ඇතිවන ගැටළු විසඳා ගැනිමට මෙය ඉවහල් වන බැවින් එම වාර්තා නොපමාව ලබා දෙන ලෙස පවසන ලදි.

**ම.සෞ.පරීක්ෂක පී. එස්. එස්. ද සිල්වා මහත.**

රත්නතිලක මහතා විලේගොඩ හංදියේ ජංගම වෙළදාම සඳහා තනි පුද්ගල ව්‍යාපාර නාම ලියාදිංචි කිරීමක් සඳහා නිර්දේශය ලබා දෙන ලෙස මා වෙත ඉල්ලීමක් ලැබුණු බවත් ඒ සඳහා නිර්දේශය ලබාදීම ගැටළු සහගත බවත් ප්‍රකාශ කරන ලදි.
තීරණය :-ජංගම වෙළදාම සඳහා නගර සභාව අවසර නොදෙන බැවින් මෙය නිර්දේශ නොකිරීම හා ඊට හේතු දැක්වීම සුදුසු බව

**වෙනත් කරුණු :-**

**සහකාර සෞ.වෛ.නි වෛද්‍ය ටී ප්‍රණීත් මහතා**

ගර්භණී මව්වරුන් දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද පොත් පිංචක් මුද්‍රණය කර ගැනීමට අවශ්‍ය බැවින් ඒ සඳහා සභාපති තුමාගේ සහාය ලබා දෙන ලෙස ඉල්ලා සිටන ලදි.

**ගරු සභාපති ඇම් ඩබ් අරුණ ප්‍රදීප් මහතා**
එම කාර්ය ඉටු කර දීමට එකඟත්වය එල කරන ලදි..

**ස්තූති කථාව**
**නගර සභා ලේකම් ඩි.වී සුනිල් මහතා.**
අද දින රැස්වීම සඳහා සහභාගී වූ ගරු සභාපතිතුමාටත්, වෛද්‍ය ටී ප්‍රණීත් මහතා ඇතුළු නිලධාරී මහත්ම මහත්මීන්ටත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙනුවෙන් සහභාගී වූ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) චන්ද්‍රජිත් මහතාටත් ගොවිජන සංවර්ධන නිලධාරී ශාන්ති මහත්මියටත් අනෙකුත් රජයේ නිලධාරීන් සියළු දෙනාටත් ස්තූතිය පුද කරන බව ප්‍රකාශ කරන ලදි.

ප.ව.4.15 ට පමණ රැස්වීමේ කටයුතු නිම කරන ලදි.

සකස් කළේ :
පී.එච්.එල්.සී.පුෂ්පරාණි.
සංවර්ධන සහකාර (සැලසුම්)

ලේකම්
ඩී.වී.සුනිල්
අම්බලන්ගොඩ නගර සභාව

**ඒ අනුව 2013 -08-27 දින පවත්වන ලද වෙළද සංගම් කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3** **2013- 08- 26** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.

**අම්බලන්ගොඩ නගර සභාව - ක්‍රීඩා කමිටු රැස්වීම**

| | | |
|---|---|---|
| දිනය | - | **2013.08.26** |
| ස්ථානය | - | නගර සභා රැස්වීම් ශාලාව |
| වේලාව | - | ප.ව. **2.30** |

**සහභාගීත්වය**
ඇම්.ඩබ්.අරුණ ප්ර2දීප් මහතා - ගරු සභාපති,අම්බලන්ගොඩ නගර සභාව
ජී.සරත් ශ්රීහ ලාල් මයා - ගරු නගර සභා මන්ත්රීබ , අම්බලන්ගොඩ නගර සභාව
ඩී.වී.සුනිල් මහතා - ගරු ලේකම් , අම්බලන්ගොඩ නගර සභාව
එස්.කේ.පත්මසිරි මහතා - ක්රීලඩා කමිටු සාමාජික

එම්.ඩබ්.කේෂාන් ප්‍රභාෂිත මහතා - ක්‍රීඩා කමිටු සාමාජික
ඩබ්.ඒ.ආර්.ගුරුසිංහ මහතා - ක්‍රීඩා ආචාර්ය, ධර්මාශෝක විද්‍යාලය
කේ.ජේ.තාබරේ ච් මහතා - රියෝ ක්‍රීඩා සමාජය
එම්.එම්.ජයන්ත මහතා - සොනෙල් ක්‍රීඩා සමාජය
එච්.වයි ද සිල්වා මහතා - ක්‍රීඩා භූමි භාරකරු නගර සභාව අම්බලන්ගොඩ
මහේන්ද්‍ර.කීරසිංහ මහතා - ක්‍රීඩා කමිටු සාමාජික
එම්.ඩබ්.ෂර්ලි පද්මසිරි මහතා - ක්‍රීඩා කමිටු සාමාජික
කේ.ජානක ලාල් මහතා - ක්‍රීඩා අංශ ප්‍රධාන -කුලරත්න විද්‍යාලය
ජී.අශෝක කුමාර මහතා - ක්‍රීඩා උපදේශක අම්බලන්ගොඩ නගර සභාව
ඉදුනිල් එදිරිවික්‍රමසූරිය මහතා - පාපන්දු පුහුණුකරු අම්බලන්ගොඩ නගර සභාව
කේ. සුරාජ් සංජීව මහතා - පුහුණු භාර ආචාර්ය ,ශ්‍රී දේවානන්ද විද්‍යාලය
ඩබ්.පී.සිල්වා මිය - සංවර්ධන සහකාර (ප්‍ර.සං. නිලධාරී වැ.බ)

**පිළිගැනීම - ගරු සභාපති - නිතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා.**

කිරිගැඩා කමිටුව සඳහා ක්‍රීඩා සමාජ නියෝජනය කරමින් පැමිණි නිලධාරීන්,පාසල් වලින් පැමිණි ක්‍රීඩා භාර ආචාර්ය මහතුන් , ක්‍රීඩා කමිටු සාමාජික මහතුන් හා නගර සභා කාර්ය මණ්ඩලය ඉතාමත් ගෞරවයෙන් පිළිගනිමින්, ප්‍රථමයෙන්ම අගෝස්තු 26 වැනි සඳුදා දිනට පැවැත්වීමට නියමිතව තිබූ ක්‍රීඩා කමිටු රැස්වීම අද දිනට කල් දැමීමට සිදු වීම නිසා කිසියම් අපහසුතාවයකට පත් වූයේ නම් ඒ සඳහා කණගාටුව ප්‍රකාශ කර සිටින ලදි.

එසේ රැස්වීම කල් දැමීමට සිදුවූයේ ජල සම්පාදන මණ්ඩලයේ සභාපතිතුමාගේ සේවය ඇගයීමේ උළෙල සඳහා සහභාගීවීමට සිදුවූ නිසා බවත් , අම්බලන්ගොඩ ජනතාවට නළ ජලය ලබා දීමට පුරෝගාමී වූයේ එම සභාපති තුමා බවත් , ඒ සඳහා එතුමන්ට කෘතගුණ දැක්වීමක් වශයෙන් අම්බලන්ගොඩ ජනතාව නියෝජනය කරමින් එම අවස්ථාවට සහභාගීවූ බව ප්‍රකාශ කරන ලදි.

ඉන් අනතුරුව න්‍යාගය පත්‍රානුකූලව ප්‍රථමයෙන්ම පසුගිය ක්‍රීඩා කමිටු රැස්වීමේ කරුණු සමාලෝචනය කිරීම සිදු කරන ලදි.

- ❖ ක්‍රීඩා පිටියට අයාලේ එන හරකුන් පිළිබඳ සාකච්ඡා කළ අතර එහිදි

**අශෝක කුමාර මහතා**

ක්‍රීඩා පිටියට ඇතුල් වන ස්ථානයේ කැරකෙන ගේට්ටුවක් සවි කිරීම සඳහා වැඩ අධිකාරීතුමා සමඟ ගොස් පරීක්ෂා කළ බව කියා සිටි අතර හරකුන් ඇතුල් වීම වැළැක්වීම අත්‍යාවශ්‍ය කටයුත්තක් බව පෙන්වා දෙන ලදි.

**ගරු සභාපති - නිතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා.**

එම ස්ථානයේ කැරකෙන ගේට්ටුවක් සවි කිරීම මගින් හරකුන් පැමිණීම වැළැක්විය හැකි ද කියා විමසීම් කරන ලදි. තවද කැරකෙන ගේට්ටුවක් පමණක් මදි බවත් සම්පූර්ණ අළුත්වැඩියාවක් කළ යුතු බවද ප්‍රකාශ කරන ලදි.

**එච්.වයි ද සිල්වා මහතා**

ඒ සඳහා සුදුසුම ක්‍රමය වන්නේ වටේටම ග්‍රිල් නෙට් එක දමා එක තැනකින් පමණක් ක්‍රීඩා පිටියට ඇතුල් වීමට සැලැස්වීම බව ප්‍රකාශ කරන ලදි.

**තීරණය - ගරු සභාපති - නිතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**

ක්‍රීඩා පිටිය වටා නිසි පරිදි ආරක්ෂික වැටක් සකස් කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙස දන්වන ලදි.

ඉන් අනතුරුව ක්‍රීඩා පිටියේ පුහුණු වීම් කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා සනීපාරක්ෂක පහසුකම් සඳහා පොදු වැසිකිළියක් ලබා දෙන ලෙස ඉල්ලීමට අදාලව සාකච්ඡා විය.

**තීරණය - ගරු සභාපති - නිතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**

ලකුණු පුවරුව පිටුපස පිරිමි, ගැහැණු දෙපාර්ශව සඳහාම පොදු වැසිකිලියක් සෑදීම සඳහා වැඩ අධිකාරිතුමා දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

නගර ක්‍රීඩා උළෙලට අදාලව පැවැත්වෙන පිහිණුම් තරඟ අගොස්තු මස 31 වන දින මාදම්පා ගඟ පිහිණුම් තටාකයෙදී උදේ 8.30 ට පැවැත්වීමට නියමිත බවත් ඒ සඳහා නගර සභාවේ ගරු නගර සභා මන්ත්‍රීවරුන්ට ආරාධනා කර ඇති බවත් සඳහන් කරන ලදි.

**එස්.කේ.පත්මසිරි මහතා,**

පිහිණුම් තරග සඳහා පැමිණෙන විනිසුරුවන් කිහිප දෙනෙකු සඳහා නවාතැන් පහසුකම් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**තීරණය - ගරු සභාපති - නිතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රදීප් මහතා**

ඒ සඳහා අ. ම. කරුණාරත්න පුරවැසි පියස වෙන් කර දෙන ලෙසත් ඒ එයට අවශ්‍ය ඇඳ ඇතිරිලි ජනසළු ආයතනයෙන් හෙටම මිලදී ගන්නා ලෙසත් දන්වා සිටින ලදි. තවද සෞඛ්‍ය අංශය දැනුවත් කර සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ සොයා බලන ලෙසද දන්වන ලදි.තවද අනෙකුත් තරග ඉසව් ගැන හා ඒවා පවත් වන දින වක වානු පිළිබද විමසා සිටි අතර එම තරගද මාස දෙකක් ඇතුළත දී අවසන් කිරීමට කටයුතු කරන ලෙස ද දන්වා සිටින ලදි.

**මහේන්ද්‍රl වික්‍රkමසිංහ මහතා**

අම්බලන්ගොඩ ථානායම අසල පිහිටි ස්වාභාවික නාන තටාකයේ ගොඩ ගැසී ඇති වැලි ඉවත් කර දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**තීරණය - ගරු සභාපති - නිතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍ර දීප් මහතා**

ශ්‍රමදානයක් පවත්වා වැලි ඉවත් කිරීමේ හැකියාව පිළිබඳ විමසා සිටි අතර වැලි කොට්ට හිර කිරීමෙන් තටාකයට වැලි ඒම වලක්වා ගැනීමට හැකි බවද පෙන්වා දෙන දෙන ලදි.

**කේ.ජේ.තාබ්රෙරේ වී මහතා**

ලකුණු පුවරුව ඉතාමත් අබලන් වී අවදානම් තත්වයක පවතින බවත් එය ඉතාමත් ඉක්මනින් අළුත් වැඩියා කර දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි.

**තීරණය - ගරු සභාපති - නිතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රkදීප් මහතා**

ඒ සඳහා වැඩ අධිකාරිතුමා දැනුවත් කර ඇස්තමේන්තුවක් සකස් කර සභාවට යොමු කරන ලෙස දන්වන ලදි.

**එස්.කේ.පත්මසිරි මහතා,**

පිහිණුම් තරග පැවැත් වෙන දින තරග කරුවන්ගේ පහසුව සඳහා සොරොව්ව වසා තැබීම අවශ්‍ය බවත් ඒ පිළිබඳ වාරි මාර්ග ඉංජිනේරු දැනුවත් කරන ලෙසත් ඉල්ලා සිටින ලදි.

**තීරණය - ගරු සභාපති - නිතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍ර<දීප් මහතා**

මේ පිළිබඳ දිස්ත්‍රික් වාරි මාර්ග ඉංජිනේරු වෙත ලිඛිතව ඉල්ලීමක් කරන ලෙස දන්වන ලදි.

**කේ.ජානක ලාල් මහතා-**

අම්බලන්ගොඩ නගර සභාවට අයත් අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමය මගින් පවත්නාගෙන යන පුහුණු ආයතනයේ පවතින පහසුකම් , නඩත්තුව කිරීම් , සනීපාරක්ෂක කටයුතු අවම මට්ටමක පවතින බවත් ඒ පිළිබඳ නගර සභාව මගින් සොයා බැලීමක් කරන ලෙස ඉල්ලීමක් කරන ලදි.

**;SrKh - ගරු සභාපති - නිතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රjදීප් මහතා**

ක්‍රීඩා කමිටුව සඳහා අම්බලන්ගොඩ බැඩ්මින්ටන් සංගමයේ සභාපති හා ලේකම් කැඳවන ලෙස දන්වන ලදි.

**එම්.ඩබ්.කේෂාන් ප්‍රñභාමහතා**

පිහිනුම් තරග දිනට පෙර ජය්බටසබට රදදප සඳහා විදුලිය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

**තීරණය - ගරු සභාපති - නිතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍ර දීප් මහතා**

අගෝස්තු 31 දිනට පෙර විදුලිය ලබා දෙන ලෙස පවසන ලදි.

**ඩබ්.ඒ.ආර්.ගුරුසිංහ මහතා**

ක්‍රීඩා පිටියෙහි ධාවන පථය ඇඳීම පිළිබද විමසීම් කරන ලදි.

**තීරණය - ගරු සභාපති - නිතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍රඅදීප් මහතා**

ධාවන පථය ඇඳීමේ කටයුතු මිනින්දෝරු මහතා වෙත භාරදී ඇති බවත් ඒ සඳහා ගෙවීම් අනුමත වී ඇති බවත් පවසන ලදි.

**ඉඳුනිල් එදිරිවික්‍ර මසූරිය මහතා**

ක්‍රීඩා පිටිය නිසි පරිදි පස් දමා සකසා ඇති බවත් , නමුත් එහි තැනින් තැන ගල් මතුවී ඇති බැවින් ළමුන්ට ක්‍රීඩා කිරීමේදී අපහසතා මතුවන බව පෙන්වා දුනි. පාසල් ළමුන් 300 ක් පමණ යොදා ගෙන ශ්‍රමදානයක් පවත්වා එම ගල් ඉවත් කිරීමට ද යෝජනා කරන ලදි.
පාසල් පටන් ගත් පසු ගරු සභාපති තුමාට මේ පිළිබද සිහිපත් කරන ලෙස දන්වන ලදි.

**වෙනත් යෝජනා පිළිබද විමසා සිටි අතර**

**ඉඳුනිල් එදිරිවික්‍රnමසූරිය මහතා**

රියෝ හා සිංහ ක්‍රීඩා සමාජ මගින් කාය වර්ධන පහසුකම් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම පිළිදව විමසා සිටින ලදි.

**කේ.ජේ.තාබ්රෙරේ වී මහතා**

ඒ සඳහා ලිඛිතව ඉල්ලීමක් කළ යුතු බව කියා සිටි අතර

**ගරු නගර සභා මන්ත්‍රීඅසරත් ශ්‍රීi ලාල් මහතා**

සිංහ ක්‍රීඩා සමාජය හා රියෝ ක්‍රීඩා සමාජය බදු කරුවන් වන බවත් නගර සභාව අයිතිකරුවන් බවත් අපට පුහුණුවක් ලබා ගැනීම සඳහා ගිවිසුම් මගින් එය ඉටු කර දෙනවාට වඩා සුහදත්වයෙන් එය කළ යුතු බවත් කියා සිටි අතර රාජ්‍ය ආය.තන වලට උදව් කරන ලෙසත් ඉල්ලීමක් කරන ලදි.

**ගරු සභාපති - නිතිඥ ඇම්.ඩබ්. අරුණ ප්‍ර;දීප් මහතා**

සිංහ ක්‍රීඩා සමාජය හා රියෝ ක්‍රීඩා සමාජය මගින් හොඳ පාඩම් ඉගෙන ගත් බව ප්‍රකාශ කළ අතර ආයුර්වේද බෙහෙත් ශාලාව පිහිටි ස්ථානය කාය වර්ධන මධ්‍යස්ථානයක් ලෙස යොදා ගන්නා බවත් එහිදී ක්‍රීඩකයින් සඳහා නොමිලේ පහසුකම් ලබා දෙන බවත් . මාස දෙකක් ඇතුලත එය ඉදිකරන බවත් පවසන ලදි.

**ජී.අශෝක කුමාර මහතා**

පාපන්දු සංචිතය හා ක්‍රිකට් ඇකඩමිය පිළිබඳව මහජනතාව දැනුවත් නොමැති බව ප්‍රකාශ කර සිටි අතර ඒ සඳහා ප්‍රචාරයක් ලබා දිය යුතු බවත් පෙන්වා දෙන ලදි.

**ගරු නගර සභා මන්ත්‍රී සරත් ශ්‍රී ලාල් මහතා**

සියළු දෙනාම නගරයේ දරු දැරියන්ගේ ක්‍රීඩා කුසලතාව වර්ධනය කිරීම සඳහා කැපවීමෙන් කටයුතු කිරීම පිළිඳව ස්තුතිය පුද කල අතර නගරයේ ක්‍රිඩා සංගම් සහයෝගයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින් පැමිණි සැම දෙනාටම ස්තුති කරමින් කමිටුවේ කටයුතු අවසන් කරන ලදි.

සකස් කළේ - ඩබ්ලිව් .පී.සිල්වා මිය
සංවර්ධන සහකාර /ප්‍රජා සංවර්ධන නිලධාරී ( වැ.බ.)

**ලේකම්,**
**අම්බලන්ගොඩ නගර සභාව**

**ඒ අනුව 2013 -08- 26 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

**7:1** **ටෙන්ඩර්** :- නැත

**7:2** **මිල ගණන්** :-

**7:2:1** වේදිකා උපකරණ සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සරත් ඉලෙක්ට්‍රිකල්ස් | රුවනරා ඉලෙක්ට්‍රිකල්ස් | උපේන්ද්‍ර ඉලෙක්ට්‍රිකල්ස් |
|---|---|---|---|---|---|
| 01 | 30’ X 40’ ප්‍රධාන වේදිකාව | | 32500/- | 35000/- | **30000/-** |
| 02 | රෙදි හට්ස් | | 1500/- | 1650/- | **1500/-** |
| 03 | ජෙනරේටරය | | 16000/- | 17000/- | **15000/-** |
| 04 | 20’ X 10’ ටෙන්ට් | අඩි 01 | 50/- | 55/- | **50/-** |
| 05 | FM මයික් | | 600/- | 600/- | **500/-** |
| 06 | බෆල් | | 1700/- | 1500/- | **1250/-** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 07 | හෝන් | | 750/- | 650/- | **600/-** |

**7:2:2** කැසට් රෙකෝඩර් සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | දිශාන් සහ දිශානි | ඒ. ජේ. ඉලෙක්ට්‍රොනික්ස් | සිංහගිරි |
|---|---|---|---|---|---|
| 01 | කැසට් රෙකෝඩර් | | Panasonic 9600/- | Telesonic 7950/- | Philips 6990/- |
| | | | | **5950/-** | |

**7:2:3** Computer sheets සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | දුලාරා ස්ටේෂනරි | ඒ. ජේ. පී. ස්ටේෂනරිස් | රේනුක් ස්ටේෂනරි |
|---|---|---|---|---|---|
| 01 | Computer sheets 9.5X11 | | 1050/- | **1030/-** | 1060/- |
| | | | | | |

**7:2:4** ර ලයිබ්‍රරියේ පරිගණක වෙන් කිරීම් සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | **Damro** | **Hemantha** | **kushantha** |
|---|---|---|---|---|---|
| 01 | Office partition for the computer (For 10 person) | | **395600/-** (Discount 15%) | මිල ගණන් ලැබී නොමැත | මිල ගණන් ලැබී නොමැත |
| | | | | | |

**7:2:5** විනෝදාංශ භාණ්ඩ සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරීගේ නිර්දේශය මත ලැබී ඇති මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | **T.A. Sugathadasa** | **Adwin & Sons** | **Toy ride Enterprises** |
|---|---|---|---|---|---|
| 01 | මෙරිගෝ රවුම | | මිල ගණන් | **75000/-** | ලැබී නැත |
| 02 | කතුරු ඔංචිල්ලාව | | සඳහන් කර | **40000/-** | |
| 03 | පුංචි කෝච්චිය | | නොමැත | **40000/-** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ප්‍රවාහනය | 51000/- | |

**7:2:6** විනෝදාංශ භාණ්ඩ සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | පී. පී. මාර්ටින් වොන්ඩර්වර්ල්ඩ් | | |
|---|---|---|---|---|---|
| 01 | Sp/ man Small bouncer<br>Ex. 5 hrs (500 X 5) | | 9500/-<br>2500/- | | |
| 02 | Noahs ark Bouncer<br>Ex. 5 hrs (500 X 5) | | 9000/-<br>2500/- | | |
| 03 | New castle Bouncer<br>Ex. 5 hrs (500 X 5) | | 9500/-<br>2500/- | | |
| 04 | Obstical Bouncer<br>Ex. 4 hrs (500 X 5) | | 14000/-<br>2000/- | | |
| | Transport | | 10000/- | | |
| | Reternable Deposite for bouncer | | 20000/- | | |
| | | | | | |

**7:2:7** ලිපි ද්‍රව්‍ය සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව | රෝයල් පොත්හල | චාමර පොත්හල |
|---|---|---|---|---|---|
| 01 | A 4 කඩදාසි (පාට මිශ්‍ර) | | 500/-<br>Avalon | 500/- | **<u>450/-</u>**<br>JK |

**7:2:8** ටී. වී. ස්ටැන්ඩ් සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඩයමන්ඩ් බ්‍රදර්ස් | පත්මා ෆර්නිචර් | |
|---|---|---|---|---|---|
| 01 | ටී. වී. ස්ටැන්ඩ් | | 6250/- | **<u>6200/-</u>** | |
| | | | | | |

**7:2:9** අනුකූලතා සහතික ලේඛන සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඩී. ආර්. එස්. ප්‍රින්ටර්ස් | ආරියදාස ප්‍රින්ටර්ස් | සක්වා ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | ටී. වී. ස්ටෑන්ඩ් | | 632.50 | 726/- | **585/-** |
| | | | | | |

**7:2:10** වාහන බැටරි සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් Exide වෙළඳනාමය යටතේ ඇති මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සුසන්ත මෝටර්ස් | විජේසූරිය මෝටර්ස් | ඇල්ෆ්‍රඩ් ද සිල්වා සහ සමාගම |
|---|---|---|---|---|---|
| 01 | 60 A බැටරි | | - | - | **-** |
| 02 | 65 A බැටරි | | 10968/- daganight | 11800/- Incoe | 12588/- Exide |
| | | | 12390/- Volta | - | - |
| | | | 12328/- lucas | - | - |
| 03 | 90 A බැටරි | | 14261/- daganight | 14100/- Incoe | 16305/- Exide |
| | | | 15393/- Volta | | |
| | | | 15720/- lucas | | |

**7:2:11** ටයර් සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සුමිත් මාර්කටින් | ආසිරි ටයර්ස් | |
|---|---|---|---|---|---|
| 01 | 215/80 R 15 Tubeless | Tyre | | | |
| | | Nankang | 16410/- | **16406/-** | |
| | | Bridgeatore | 29577/- | | |

**7:2:12** ඩිජිටල් බැනර් මුද්‍රණය සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තිරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | අක්රා ෆොටෝ | එඩ්වින් ස්ටුඩියෝ | ඩයමන්ඩ් ඇඩ්වර්ටයිසින් |
|---|---|---|---|---|---|
| | ඩිජිටල් බැනර් මුද්‍රණය | | | හතරැස් අඩිය | |
| | 1 ½’ X 2’ | | 120/- | 39/- | ලැබී නැත |
| | 18’ X 7’ | | 5670/- | 60/- | |

**7:2:13** සහතික හා පෝස්ටර් සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | DRS Printers | Ariyadasa Printers | Sakva Printers |
|---|---|---|---|---|---|
| 01 | ලෝක ළමා දින සැනකෙළිය සඳහා අත් පත්‍රිකා | 10000/- | 6/32 | 5/10 | **4/75** |
| 02 | වර්ණ හතරකින් යුත් පෝස්ටර් | 2000/- | 16/40 | 13/75 | **12/25** |
| 03 | පෙර පාසල් පාලිකාවන් සඳහා සහතික පත්‍ර | 500/- | 19/90 | 20/- | **18/90** |
| 04 | පෙර පාසල් ළමුන් සඳහා සහතික පත්‍ර | 7500/- | 6/85 | 8/25 | **6/70** |

**7:2:14** කාර්යාල උපකරණ (E-library) සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Pathma furniture | Diamond furniture | Damro |
|---|---|---|---|---|---|
| 01 | පරිගණක පුටු | | 7600/- | **6000/-** | 6475/- |
| 02 | ලියන මේස | | **7250/-** | 10500/- | 11875 |
| 03 | වීදුරු කැබිනට් | | 22300/- | 49000/- | **18875** |

**(08)** ගෙවීම්

8. 1 ඇ. අංක 0639 යටතේ ලබා ගත් ලිපිද්‍රව්‍ය සඳහා කුලරත්න පාර, අම්බලන්ගොඩ, සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි, රු. 24700/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

Special Letterhead 50 X 494/- - 24700.00

8.2 ඇ. අංක 0641 යටතේ ගබඩාවට ලබා ගත් ලිපි ද්‍රව්‍ය වෙනුවෙන් අම්බලන්ගොඩ , මහාවිදිය රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 16250/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

Ronio papers 50 X 325/- - 16250.00

8.3 ඇ. අංක 0650 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද පරිගණක උපාංග වෙනුවෙන් අම්බලන්ගොඩ, ගාලු පාර ටියුලිප් කම්පියුටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 34100/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8. 4 ඇ. අංක 0640 යටතේ ලබා ගත් පරිගණක සඳහා අම්බලන්ගොඩ, ගාලු පාර ටියුලිප් කම්පියුටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 47100/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.5 ඇ. අංක 0664 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද CFL බල්බ් සඳහා බොරලැස්ගමුව, පරණ කැස්බෑව පාර පොලිකෝම් ඉලෙක්ට්‍රිකල්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 79968/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| CFL bulb 18W 357/- X 200 | | - | 71400.00 |
| | Vat | - | 8568.00 |
| | | | 79968.00 |

8.6 ඇ. අංක 0643 යටතේ කාර්යාලයට ලබා ගත් ටයර් වෙනුවෙන් ඇල්පිටිය පාර සුමිත් මාර්කටින් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 11264/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 500 X 12 Tyre | 5632/- X 02 | - | 11264.00 |

8.7 ඇ. අංක 0629 යටතේ කාර්යාලයට ලබා ගත් ටයර් වෙනුවෙන් ගාලුපාර, අම්බලන්ගොඩ ආසිරි ටයර් වර්ක්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 181680/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 12.4 X 11.28 Tyre | 41200/- X 04 | - | 165680.00 |
| 12.4 X 11.28 Tube | 4000/- X 04 | - | 16000.00 |
| | | | 181680.00 |

8.8 ඇ. අංක 0649 යටතේ කාර්යාලයට ලබා ගන්නා ලද රූපවාහිනි යන්ත්‍රය වෙනුවෙන් අම්බලන්ගොඩ, ගාලුපාර සොෆ්ට්ලොජික් ෂෝරූම් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 36900/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| LED 22" television | 36900/- X 1 | - | 36900.00 |

8.9 ඇ. අංක 0063 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ගබඩා භාණ්ඩ වෙනුවෙන් අම්බලන්ගොඩ BKS කම්පැනි වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 16580/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| Padlock 2" 10 X 530/- | - | 5300.00 |
| Cement 02 X 915/- | - | 1830.00 |
| Chemtin 50kg | - | 9450.00 |
| | | 16580.00 |

8.10 ඇ. අංක 0661 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද GAS වෙනුවෙන් අම්බලන්ගොඩ, මහාවීදියේ එම්. පී. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57920/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | |
|---|---|---|
| 37.5 kg LP GAS 8 X 7240/- | - | 57920.00 |

8.11 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසරය සඳහා 2013 ජුලි මස 01- 15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 19334.50 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සි/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|

| | | |
|---|---|---|
| 4095 | ඩීසල් | 145 |
| | Engine Oil | 05 |

8.12 නගර සභාව සතු RA-3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 ජුලි මස 01- 15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10882.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4121 | ඩීසල් | 40 |
| | එන්ජින් ඔයිල් | 03 |
| 4132 | ඩීසල් | 39 |

8.13 නගර සභාව සතු 49- 9421 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 ජුලි මස 01- 15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10172.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4088 | ඩීසල් | 36 |
| 4104 | ඩීසල් | 48 |

8.14 නගර සභාව සතු 49- 9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 ජුලි මස 01- 15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10147.50 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4091 | ඩීසල් | 35 |
| 4100 | එන්ජින් ඔයිල් | 03 |
| 4101 | ඩීසල් | 40 |

8.15 නගර සභාව සතු LF-1853 අංක දරණ ටිපර් රථය සඳහා 2013 ජුලි මස 01- 15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10535.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4085 | ඩීසල් | 67 |
| 4097 | ඩීසල් | 20 |

8.16 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 ජුලි මස 01- 15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 22826.30 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4081 | ඩීසල් | 40 |
| | එන්ජින් ඔයිල් | 01 |
| 4087 | ඩීසල් | 46 |
| 4102 | ඩීසල් | 50 |
| 4112 | ඩීසල් | 47 |
| | එයර් ෆෙෂ්නර් | කෑට 01 |

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්**

සභාපතිතුමනි මෙම වියදම ඉතා වැඩි මුදලක්. ඒ නිසා මේ ගෙවීමට අපි විරුද්ධයි. ඒවගේම මෙම කැබ් රථය පසුගිය දින තිබුණ සමුපකාර ඡන්දෙදි පාවිච්චි කලා.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මෙම කැබ් රථය සභාපතිතුමාගේ නිල රථය. එතුමාට රාජකාරී කටයුතු සඳහා මේ වාහනය භාවිතා කරන්න පුලුවන්.

සභාවේ ඝෝෂාකාරී තත්වයක් ඇති විය.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

මෙම වාහනය සභාවේ නිල වාහනය. මමත් ගිය සුමානෙ දවස් දෙකක් මේ වාහනෙන් කොළඹ ගියා සභාවෙ වැඩ වලට. මේ වාහනය පාවිච්චි කරන්නෙ මේ සභාවෙ වැඩ වලට.

**මෙම ගෙවීම සඳහා ඡන්දය විමසනු ලදුව ගෙවීම ට පක්ෂව ගරු සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා යන අයද , විපක්ෂව ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා , ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අයද ඡන්දය ප්‍රකාශ කල අතර වැඩි ඡන්ද දෙකකින් මෙම ගෙවීම සභා සම්මත විය.**

8.17 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 ජූලි මස 15- 31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 34862.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4118 | ඩීසල් | 45 |
| 4119 | ඩීසල් | 40 |
| 4128 | ඩීසල් | 45 |
| 4129 | ඩීසල් | 40 |
| | එන්ජින් ඔයිල් | 01 |

| | | |
|---|---|---|
| 4140 | ඩීසල් | 52 |
| | පවර් ස්ටියරින් ඔයිල් | කැට 01 |
| 4143 | ඩීසල් | 55 |

**මෙම ගෙවීම සඳහා ඡන්දය විමසනු ලදුව ගෙවීම ට පක්ෂව ගරු සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා යන අයද , විපක්ෂව ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා , ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අයද ඡන්දය ප්‍රකාශ කල අතර වැඩි ඡන්ද දෙකකින් මෙම ගෙවීම සභා සම්මත විය.**

8.18 නගර සභාව සතු 49- 9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 ජුලි මස 15- 31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10276.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4125 | ඩීසල් | 41 |
| 4134 | ඩීසල් | 38 |
| | එන්ජින් ඔයිල් | 02 |

8.19 නගර සභාව සතු RA-3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 ජුලි මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10631.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4121 | ඩීසල් | 40 |
| | එන්ජින් ඔයිල් | 03 |
| 4132 | ඩීසල් | 39 |

8.20 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසරය සඳහා 2013 ජුලි මස 15- 31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 14653.10 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4136 | ඩීසල් | 121 |

8.21 නගර සභාව සතු LF- 1853 අංක දරණ ටිපර් රථය සඳහා 2013 ජුලි මස 15- 31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13684.30 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 4116 | ඩීසල් | 67 |
| 4142 | ඩීසල් | 46 |

8:22 2013 මැයි මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 I | 47098.00 |
| 23453 I | 1692.00 |
| 34453 I | 3433.00 |
| 52453 I | 38696.28 |
| 53454 | 21666.55 |
| 62453 I | 24136.27 |
| | 136723.76 |

විදුලි බිල්පත් සඳහා රු. **136723.76** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:23 2013 මැයි මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 52453 II | 37007.80 |
| 62453 II | 12017.30 |
| 34453 II | 937.44 |
| 23453 II | 11752.56 |
| 11453 II | 9116.80 |
| | 70831.90 |

ජල බිල්පත් සඳහා රු: **70831.90** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.24 හිරේවත්ත පිහිණුම් තටාකය අසල ඉදිකරන ගොඩනැගිල්ලට ජල සම්බන්ධතාවය ලබා දීම සඳහා කානු කැපීම සඳහා JCB යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් රු. 13020/- ක මුදලක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.25 252-0730 කැබ් රථය රක්‍ෂණ වාරිකය වෙනුවෙන් රු. 29355.15 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.26 කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු. 17701.60 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ජෙනරල් සේල්ස් කම්පැනි වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.27 වයිබ්රේටින් රෝල අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු. 104529.60 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ජෙනරල් සේල්ස් කම්පැනි වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.28 මහජන සෞඛ්‍ය පරීක්‍ෂක පී. එස්. එස්. ද සිල්වා මහතා සහ ඩබ්. එන්. අයි. මෙන්ඩිස් මහතා වැඩ ආවරණ කටයුතු සඳහා යෙදවීම වෙනුවෙන් ඔවුනට හිමි වැඩ ආවරණ දීමනා , දුරකථන දීමනා, ප්‍රවාහන දීමනා ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.29 වරිපනම් බදු එකතුකිරීමේ විශේෂ වැඩසටහන යටතේ හිග වරිපනම් බදු එකතුකිරීම වෙනුවෙන් නිලධාරීන්ට ගෙවිය යුතු රු. 21293.30 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:30 පුස්තකාල සඳහා සපයන ලද පුවත්පත් වෙනුවෙන් 2013 ජූලි මාසය සඳහා රු. 37665.00 ක මුදලක් ප්‍රජා සංවර්ධන නිලධාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:31 2013 ජූලි මාසය සඳහා VAT මුදල වන රු. 50000.00 ක මුදලක් ගණකාධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:32 හිරේවත්ත නාන තොටුපොල අසල ඇඳුම් මාරු කිරීමේ ස්ථානයට විදුලි බල සම්බන්ධතාවය ලබාගැනීම වෙනුවෙන් රු. 25280.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:33 සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුලු නාගරික මන්ත්‍රීවරුන්ගේ ගමන් වියදම් වෙනුවෙන් රු. 24000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:34 හිගල්දුව පාර පැතිබැම්ම ඉදිකිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම වෙනුවෙන් රු. 105246.45 ක මුදලක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි තිලකපුර බෙන්වල එක්සත් ගොවි සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:35 හිරේවත්ත නාන තොටුපොල අසල ඇඳුම් මාරු කිරීමේ ස්ථානයේ කර්මාන්තයේ අවසාන වෙනුවෙන් රු. 419705.94 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි හෙප්පුමුල්ල කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:36 විද්‍යුත් පුස්තකාලය සඳහා දුරකථන පහසුකම් (අන්තර්ජාල පහසුකම් හා රවුටරයක් සහිත) ලබා දීම වෙනුවෙන් රු. 11590.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:37 වයිබ්රේටින් රෝල සහ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු. 20000.00 ක අත්තිකාරම් මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:38 හෙප්පුමුල්ල පෙර පාසලේ හා පුස්තකාල ගොඩනැගිල්ලේ සිවිලිං සවි කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන රු. 34420.47 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි ආර්. ර්. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම.

8:39 පින්නදූව III හරස් පාර කොන්ක්‍රීට් කුට්ටි අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම වන රු. 500000.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි බටපොල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා ගැනීම.

## (09) ගිණුම්

**9:1** 2013 ජුලි මාසයේ වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2013 ජුලි මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති කමල් වැල්ලගේ මහතාගේ හා ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

**10.1** ජාතික කියවීමේ මාසය - 2013 වෙනුවෙන් පුස්තකාලයාධිපති විසින් සකස් කරන ලද රු. 223000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.2** පින්නදූව 3 වන පටුමග අන්තර් සම්බන්ධිත ගල් අතුරා සංවර්ධනය කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 28106.10 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.3** ආර්. පී. ආතර් ද සිල්වා මාවත කොන්ක්‍රීට් කිරීමසඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 221662.10 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.4** හිරේවත්ත පිහිනුම් ස්ථානයේ ඇදුම් මාරු කිරීමේ ස්ථානය සෑදීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 127001.00 ක් වූ අතිරේක ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**තීරණය**

☛ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.5** මහ අම්බලන්ගොඩ පුස්තකාලය අසල කාණුව සකස් කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 100960.20 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මෙතන තියෙන කාණුව ඉවත් කරලද හදන්නෙ. එහෙම නම් මෙතන රජයේ මුදල් දෙවතාවක් වියදම් වෙනවා. මේක මීට අවුරුදු තුනකට කලින් හැදුවෙ.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ඔය කාණුවෙ මම කිසිම අඩුපාඩුවක් දකින්නෙ නෑ. ඕකට ස්ථානීය පරීක්ෂණයක් කරල වාර්තාවක් දෙන්න. එතකොට සභාවෙන් තීරණයක් ගන්න පුලුවන්.

**තීරණය**

☛ **මෙම ඇස්තමේන්තුව ඊලග සභා වාරයට ඉදිරිපත් කිරීම සඳහා තීරණය ලදී.**

**10.6** හිටපු සභාපති මිචෙල් ද සිල්වා මහතාගේ නිවස අසලින් යන හරස් පාර අන්තර් සම්බන්ධිත කුට්ටි අතුරා සංවර්ධනය කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 439639.50 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ඔය පාර මම ගිය අවුරුද්දෙ කරන්න ගියහම ඔතන නඩුවක් තියෙනවයි කියල කරන්න බැරි වුනා. එහෙම ප්‍රශ්නයක් තියෙන දෙයක් කරල මට බැහැ ගෙවීම් වලට එකග වෙන්න. මම දැනුවත්ව තාම මේකෙ නීතිමය ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

මේක මන්ත්‍රීතුමිය ඉදිරිපත් කරල මධ්‍යම ආණ්ඩුවෙන් අනුමත වෙලා ආපු එකක්. ඒ නිසා සභාවෙ අපට ගැටලුවක් වෙන්නෑ.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

සභාපතිතුමනි අපේ මන්ත්‍රීතුමා කියපු විදියට අපේ ගරු සභාවෙන් ගෙවීමට අපහසු දේකදී මෙහෙම කරන්නෙ කොහොමද? අපේ ගරු මන්ත්‍රීතුමා විසින් මීට අවුරුද්දකට පෙර ඉදිරිපත් කරපු අවස්ථාවෙදී මෙතුමා ගොඩක් අසීරු තත්වෙකට පත් වුනා. දැන් ඒව නිවැරදි වෙලාද ?

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

එතුමියට තියෙන්නෙත් අපට තියෙන අයිතියම තමයි. අපි ඇස්තමේන්තුව සම්මත කරමු. එතුමිය ඒක බේර ගනීවි.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.7** හිරේවත්ත පුස්තකාලය අසල හරස් පාර අන්තර් සම්බන්ධිත ගල් අතුරා සංවර්ධනය කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 425153.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

- **පෙ. ව. 11.55 ට පමණ තේ පානය සඳහා සභාව මදකට නතර කරන ලදී.**
- **පෙ. ව. 12.05 ට පමණ තේ පානයෙන් පසුව සභාව නැවත ආරම්භ කරන ලදී.**

**(11)** වෙනත් කරුණු නැත

**(12)** න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** ' නගර සභා ආපනශාලාව ටෙන්ඩර් කිරීම සම්බන්ධව ' මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපි ගොනුව සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභා ආපනශාලාවේ බදු ගිවිසුම් කාලය 2013-09-15 දිනෙන් අවසන් වන බවත් ඒ සඳහා ගාස්තු වශයෙන් වාර්ෂික බදු මුදල රු. 85000/-, ටෙන්ඩර් ඇප රු. 5000/-, ටෙන්ඩර් පෝරම ගාස්තු රු. 250/- වශයෙන් එය නැවත ටෙන්ඩර් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **නගර සභා ආපනශාලාව ටෙන්ඩර් කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:2** ‘ සභා තිරණ දැනුම් දීම “ මැයෙන් තොරතුරු තාක්‍ෂණ සන්නිවේදන සහකාර මිය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සභාගත කරන ලදී.

ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් 2013-08-06 දින මාසික සභාවේදී දක්වන ලද අනුරාධපුර මහ නගර සභාවේ ගරු මන්ත්‍රීවරුන් හට අයිපෑඩ් ලබා දීම බිළිබඳව විස්තර සොයා බැලූ බවත් එහිදී ඔවුව් විසින් පවසා සිටියේ මාසික සභාවේ ඉදිරිපත් කරන ලද යෝජනාවක් ස්ථිර කර ගැනීමෙන් අනතුරුව මන්ත්‍රීවරුන්ට අයිපෑඩ් ලබා දුන් බවත් එම නිසා මෙය යෝජනාවක් ලෙස මාසික සභාවට ඉදිරිපත් කර ස්ථිර කර ගැනීමෙන් ඉදිරි කටයුතු කල හැකි බවත් දන්වා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

අම්බලන්ගොඩ නගර සභාවේ මන්ත්‍රීවරුන්හට අයිපෑඩ් ලබා දීමට කටයුතු කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නිය.

ඉහත යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි පළමු දිනයේදීත් මේ සම්බන්ධව කතා කරා. තාක්‍ෂණයත් සමග ඉදිරියට යාමේදී අපිට වෙනත් සභාවලත් මෙය ලබා දීම සිදු වෙලා තියෙනවා. අපේ සභාවෙ මන්ත්‍රීවරුන්හට මේ අයිපෑඩ් ලබා දීමෙන් අපි ඉදිරියට යායුතුයි. මහජනතාවට කාර්යක්‍ෂම සේවයක් සැපයීම සම්බන්ධව මීට ප්‍රථම මන්ත්‍රීවරුන්ට යතුරුපැදි ලබා දීම සිදු කරා. ඒවගේම මේ සම්බන්ධව පුහුණුවකුත් ලබා දීම සිදු කරන්න කියල ඉල්ලීමක් කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි මෙය ලබා දෙන්නෙ නගර සභාවෙ මුදලින්ද?

<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>

ඔව් සභාවෙ මුදලින්.

<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි එහෙමනම් මට එපා. මම විරුද්ධවීමක් නෙමෙයි. මම ප්‍රතිපත්තියක් විදියට ගන්නෙ නැහැ. මට ඒකාලෙ ඉන්දියාවෙ යන්න ලැබුන. නගර සභාවෙ මුදලින් මට යන්න තිබුන. නමුත් මම ගියේ නැහැ. මේ දේ නගර සභාවෙන් හැර රජයෙන් හරි ලැබෙනව නම් මම ගන්නව. ඒ නිසා නගර සභාවෙ මුදලින් මට අයිපෑඩ් උපකරණය එපා කියල මම ප්‍රකාශ කරනවා.

<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි අපට යතුරු පැදි ලබා දුන්නට අපෙන් මුදල් අය කරනවා. මම යෝජනා කරනවා මේ උපකරණයත් ඒ විදියට අයකරගෙන දෙන්න කියලා.

<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>

සභාපතිතුමනි රාජ්‍ය තන්ත්‍රය තුල තව ටික දිනකින් මෙවැනි මෙවලම් සුලභ දේවල් වෙනවා. ප්‍රතිපත්තිමය වශයෙන් මමත් පුද්ගලිකව නොගත්තත් සහෝදර මන්ත්‍රීවරුන්ගෙ අවශ්‍යතාවක් තිබේනම් අර කියූ ආකාරයට නගර සභා මුදලින් නොවන

ආකාරයකට මොකද මේ වෙලාවෙ සභාවෙ මුදල් මේ වෙනුවෙන් වියදම් කිරීමෙන් ප්‍රශ්නයක් වෙනවට වඩා පළාත් සභාවෙන් හෝ රාජ්‍ය ආයතනයකින් මේ දේවල් ලබා ගන්න පුලුවන්නම් වඩා උචිතයි කියල මම විශ්වාස කරනවා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්**

සභාපතිතුමනි තරුණ මන්ත්‍රීවරයෙක් විදියට කිත්සිරි මන්ත්‍රීතුමා ගෙනා මෙම යෝජනාව අනුව තමන්ට කැමති කෙනෙක් මේක අරගෙන කැමති කෙනෙක් නොගෙන හිටියට ගැටලුවක් නැහැ.

**ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්**

අම්බලන්ගොඩ නගර සභාව ජනතාවගේ මුදල් නාස්ති කරන තැනක් නෙමෙයි.

මේ සම්බන්ධයෙන් ඡන්දය විමසනු ලදුව පක්ෂව ගරු සභාපති කමල් වැල්ලගේ මහතා , ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා, ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා යන අය ඡන්දය ප්‍රකාශ කල අතර විපක්ෂව එක් ඡන්දයක්වත් නොලැබුණි. ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා , ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා යන අය ඡන්දය දීමෙන් වැලකී සිටින ලදී. ඡන්දය විමසන අවස්ථාවේදී ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා සභා ගර්භයේ නොසිටින ලදී.

**තීරණය**

☛ **ගරු නගර සභා මන්ත්‍රීවරුන්ට අයිපෑඩ් ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:3** **'** නැණ පුබුදු පරිගණක ශිෂ්‍යත්ව වැඩසටහන ආරම්භක වැඩමුලුව සඳහා ශාලා පහසුකම් ලබා ගැනීම **"** මැයෙන් දකුණු පළාත් සභා ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

පාසල් දරුවන් සඳහා නොමිලේ පරිගණක දැනුම ලබා දෙන නැණ පුබුදු පරිගණක ශිෂ්‍යත්ව වැඩසටහනේ සමාරම්භක අවස්ථාව සඳහා 2013 සැප්තැම්බර් 03 වන දින නගර ශාලාව ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **2013 සැප්තැම්බර් 03 වන දින නගර ශාලාව නොමිලේ ලබාදීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:4** **'** භාණ්ඩාගාර බිල්පත්වල මුදල් ආයෝජනයට අනුමැතිය ලබා ගැනීම **"** මැයෙන් පොත් තබන නිලධාරිණිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

සභාවේ අතිරික්ත මුදල් නගර සභා ආඥා පනතේ 158(4) වගන්තිය අනුව ආයෝජනය කල හැක්කේ රජයේ සුරැකුම්පත්වල පමණක් බවත් ඒ අනුව වැඩි පොලී අනුපාතයක් ලැබෙන සී/ස එන්ට්‍රස්ට් සෙකියුරිටි ආයතනයේ ආයෝජනය කිරීමට අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**තීරණය**

☛ **නගර සභා ආඥා පනතේ 158(4) වගන්තිය අනුව භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

- **පෙ. ව. 10.45 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය සභා ගර්භයට පැමිණෙන ලදී.**

**12:5** ‘ **2013-08-06** දින පැවති මාසික සභාවේ සාකච්ඡා සම්බන්ධයෙනි ‘ මැයෙන් අභ්‍යන්තර විගණන නිලධාරිතුමිය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සභාගත කරන ලදී.

2013- 08- 26 දින මා හට ලබා දෙන ලබා දෙන ප්‍රකාශනය අනුව ගොඩනැගිලි විෂය නිලධාරිණියට විරුද්ධව නිසි අයුරින් කරුණු ඉදිරිපත් නොවීම හේතුවෙන් මේ පිළිබඳව වැඩිදුර පරීක්ෂණ කිරීමට නොහැකි බව දන්වා තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:6** ‘ ගාල්ල දිස්ත්‍රික් මිල කමිටුව 2013 වර්ෂයේ දෙවන භාගය සඳහා මිල ගණන් ‘ මැයෙන් ගාල්ල දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ගාල්ල දිස්ත්‍රික් මිල කමිටුව විසින් 2013 වර්ෂයේ දෙවන භාගය සඳහා එවා ඇති මිල ගණන් ඉදිරිපත් තිබුණි. මෙම මිල ගණන් 2013-07-01 දින සිට වලංගු වන බවත් දන්වා තිබුණි.

<u>තීරණය</u>

☛ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:7** ‘ ප්‍රදර්ශන පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට අවසර ලබාගැනීම ‘ මැයෙන් සිරිනිකේතාරාම මහා විහාරයේ විහාරාධිපති හිමියන් විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

මේ මස 25 දින බොදු බලසේනා බොදු සමුලුවක් ගාල්ල සමනළ ක්‍රීඩාංගනයේදී පැවැත්වෙන බවත් ඊට අදාල ප්‍රචාරක පුවරුවක් ගාස්තු අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **බොදු බලසේනා බොදු සමුලුව සඳහා ප්‍රචාරක පුවරුවක් ගාස්තු අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

✪ වෙනත් කරුණු

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි පරීක්ෂණයක් සඳහා මම කොමිටියකට දාල තියෙනවා. මගේම ඥාතියෙකුගෙ ප්‍රශ්නයක් සම්බන්ධව. ඒ නිසාම නෙමෙයි මම මන්ත්‍රී කෙනෙක් විදියට නිලධාරීන් කරන්න ඕන රාජකාරී වලට මම යන්නෙ නැහැ. එනිසා මම මේ කොමිටියෙන් අයින් කරන්න කියල ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

මේ ප්‍රශනෙදි නිලධාරීන් කිහිප වතාවක් ගිහිල්ල පරීක්ෂණ කරා. එයින් සෑහීමකට පත් වෙන්නෙ නැති නිසා තමයි මන්ත්‍රීවරු පත් කරේ පරීක්ෂණයට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මේ ප්‍රශ්නයට කරන්න ඕන දේ ලේකම් තුමා විසින් ලිඛිතව දන්වල තියෙනවා. ඒ කියපු දේ කරලද කියල බලන එක තමයි මේ කමිටුවෙන් කරන්න ඕනෙ.

**<u>තීරණය</u>**

මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා සමග අනිකුත් නම් කරන ලද ගරු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටුව මගින් තීරණයක් ගැනීමට සභාව තීරණය කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මම මේ ප්‍රශ්නය සභාපතිතුමාගෙන් අහන්න හිටියෙ. මේ රණසිංහ මහතාට නියෝගයක් දීල ලිපියක් යවල තියෙනව සභාවෙන්. ඒකෙ නඩුවක් තියෙනවා. නඩුවක් තියෙන දේකට එහෙම නියෝගයක් දෙන්න පුලුවන්ද කියලා මට දැනගන්න ඕනෙ.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

එහෙම පුලුවන්කමක් තියෙන නිසා තමයි ලියුම අරින්න ඇත්තෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මේ ප්‍රශ්නයත් මම සභාපතිතුමාගෙන් ගිය සභාවෙදි අහන්න හිටියෙ. එතුමා ලංකාදීප පත්තරේට ප්‍රකාශයක් කරල තිබුන අපේ දකුණු මායිමේ තියෙන පාලමේ ලයිට් දාන එක අපට අයිති නැහැයි කියලා. ඒක අයිති රත්ගම ප්‍රාදේශීය සභාවටයි කියලා. ඒ අය කියල තියෙනව අපි කරන්නම් කියලා. සභාපතිතුමනි අපි පාලම හදල විවෘත කරන කොටම සභාවට ආව ඉල්ලීමක් මේ ලයිට් දාන්න කියල. ඒ වෙලාවෙ අපිට ලයිට් දාන්න තියෙන ඉනිමග මදි. ඒකෙන් වැඩේ පස්සට ගියා. නමුත් එදා තීරණයක් තියෙනව මේ ලයිට් අපි දැමිය යුතුයි කියලා. පී. ද. එස්. කුලරත්න මහත්තය ඇනිකට් එක හැදුවෙ අපිට අයිති නිසා. එක සැරයක් පළාත් සභා මන්ත්‍රී කුමාර මහත්මය ඇවිල්ල ගැහුව බෝඩ් එකක්. පී. එම්. එස්. මහත්මය ගිහිල්ල ඒක එහෙම්මම ගැලෙව්ව. ඒ අයිතිය අපි තියාගන්න ඕනෙ.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

එහෙම දෙයක් සභාපතිතුමා කිව්වද කියල මම දන්නෙ නැහැ. එහෙම කියන්නෙ නැහැයි කියල මට විශ්වාසයක් තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මම කියා සිටිනවා විදුලි බල මණ්ඩලයේ උදව්හරි අරගෙන මේකෙ ලයිට් ටික දාන්න කියල.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි නවීන උපකරණයක් භාවිතා කරල මේ ලයිට් ටික දාන්න පුලුවන්. ඒ දේ ඉක්මනින් කරන්න කියල මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අපි පළමුව මේ පුවත්පත නිවැරදි කල යුතුයි. සභාපතිතුමාට එවැනි අදහසක් ඉදිරිපත් කරන්න හේතුවක් නැහැ. මේකෙ ප්‍රශ්නෙ තියෙන්නෙ අම්බලන්ගොඩ සීමාව තීරණය වෙන තැන නිසයි. මෙතන ලයිට් දාන්න ගියහම අපිට ඒකාලෙ උස ඉනිමගක් තිබුනෙ නැහැ. ලෙකෝ එකට ගියහම ඒ අය කියනවා වීථි ලාම්පු සීමාවක් තියෙනවා කියලා. සභාපතිතුමාට මෙහිදී වගකීමක් තියෙනවා ලෙකෝ එකෙන් අවසර අරගෙන මහා මාර්ග දෙපාර්තමේන්තුවෙන් අවසර අරගෙන අපේ අරමුදලෙන් හරි මේ පාලමට විදුලිය ලබල දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි කලුවඩුමුල්ල මාර්ග සතිපාර නඩත්තු කටයුතු විධිමත් කිරීම කියල ලියුමක් ඉදිරිපත් කරල තියෙනව. මාර්ග සතිපාර විවෘතකර වසර කිහිපයක් වන බවත් තවමත් තාර දමා නැති බවත් විදුලි ආලෝකය නොමැති බැවින් අයථා කටයුතු සිදුවන බවත් එමනිසා මෙම මාර්ගය විධිමත් නගර සභා මාවතක් බවට පත් කර දෙන ලෙස ඉල්ලා තිබෙනවා.

- **පෙ. ව. 11.45 ට පමණ ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා මුලාසනයේ අසුන් ගන්නා ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

ඒවගේම තවත් ඉල්ලීමක් තිබෙනවා කලුවඩුමුල්ල ක්‍රීඩා පිටිය සම්බන්ධවයි කියලා. ක්‍රීඩාපිටිය දෙසට වැඩුනු ගස් කිහිපයක අතු නැමී ඇති බවත් එම ගස් කඩා වැටුනහොත් පස් කණ්ඩිය කැඩී යාම නිසා බැම්මක් බැදීමට සිදුවන බවත් එමනිසා කඩිනමින් මේ සම්බන්ධව කටයුතු කරන ලෙසත් ඉල්ලා තිබෙනවා.

ඒවගේම තවත් ලිපියක් තියෙනවා කලුවඩුමුල්ල ක්‍රීඩා පිටියේ ඉදිකර ඇති ළමා ක්‍රියාකාරකම් හා විනෝදය සඳහා තනවා ඇති භාණ්ඩ සම්බන්ධවයි කියලා. 2013 ලෝක ළමා දිනයට පෙර ළමුන්ගේ විනෝදය සඳහා ඉදිකර ඇති උපාංග නිසි ලෙස සකස් කොට දෙන ලෙස ඉල්ලා තිබෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

ඒවගේම තවත් ඉල්ලීමක් තිබෙනවා එල්. එල්. මනුල ජානක කියන අයගෙන්. පදිංචි සහතිකය ලබා ගැනීම සම්බන්ධවයි කියලා. මාගේ දෙමහල් නිවසේ උඩු මහල සඳහා වෙනම වරිපනම් අංකයක් ලබා ගැනීමට අවශ්‍ය බවත් උඩු මහල සඳහා වෙනම විදුලි මීටරයක් ලබා ගැනීමට අදහස් කරන බවත් මේ ගැන සලකා බලා පදිංචි සහතිකය හෝ මාගේ අවශ්‍යතාවය වෙනුවෙන් විකල්පයක් සලසා දෙන ලෙසත් ඉල්ලා තිබෙනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

නීතියට අනුව කරන්න ඕන විදිය ඒ අයට දන්වල තියෙනවා. සානුකම්පිත හේතුමත අලුතින් අංක දෙන්න සභාවට බැහැ. සැලසුම් අනුමත කරන්නෙ නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන්, නගර සභාවෙ නිලධාරීන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිලධාරීන්ගෙ නිර්දේශ වලට. අපි කරන්නේ සංකේතාත්මකව අත්සන් කරන එක විතරයි.

<u>තීරණය</u>

මේ සම්බන්ධයෙන් තාක්ෂණසේවා නිලධාරීන්ගෙන් උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට සභාව තීරණය කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අපේ කඩ කාමර සම්බන්ධයෙන් විගණන විමසුම් ඇවිල්ල තියෙනවා. මම දන්න කෙනෙකුගෙනුත් විමසීමක් කරල තිබුන. එතුමා අතුරු බදු ගිවිසුමක් කරල නෑ. ඒ අදාල ස්ථාන වල රට වඩා සුපරීක්ෂාකාරී විය යුතු කරුණු තියෙනවා. ඒ දේවල් ගැන පරීක්ෂාකාරී වෙලා නැහැ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

පසුගියවර ආපු විගණන නිලධාරීන් ගෙනිල්ල තිබුනෙ වැඩකට නැති විගණන විමසුම්. අපේ බදු කරුවන් විසින් දෙන සාධාරණ හේතු අපි විගණනයට දන්වල යවනවා. අම්බලන්ගොඩ නගර සභාව උපරිම පාරිශුද්ධත්වයෙන් වැඩ කටයුතු කරල තියෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ද ෆිනැන්ස් එකෙන් ගනිපු ඉඩමක් කැබලි කරපු ඉඩමක පර්චස් ගාන අඩුවෙන් තක්සේරු කරල කියල විගණනයෙන් කම්පැනියෙ අය ගෙන්නල තියෙනව. ඒ අයට කියල තියෙන්නෙ මෙහෙන් තාම ඒව දීල නැහැයි කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මෙතන වෙලා තියෙන්නෙ ප්‍රමාද වෙලා පිළිතුර යැවීම. මේ ප්‍රමාදය ආයතනයට හොඳ නෑ. ලේකම්තුමා මේ ගැන සොයා බලන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඕකන්ද ජයබෝධි විහාරය වටා තාප්පයක් බඳිනව මේ දවස්වල. ඒ සම්බන්ධව යංග්ප්ලේයර්ස් ක්‍රීඩා සමාජයේ සභාපතිතුමා මට ලිපියක් යොමු කරා. පොදු පහසුකම් සඳහා ලබාදී ඇති ඉඩම් කොටසේ අනවසරයෙන් ජයබෝධි විහාරයේ තාප්පයක් බැඳීම සම්බන්ධව. සති තුනකට කලින් තමයි මේක බඳින්න ගත්තෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මේ සම්බන්ධයෙන් ඊයේ ලිපියක් ලැබිල තියෙනවා. මේකට ස්ථානිය පරීක්ෂණයක් කරන්න ගියා. තාම මට වාර්තාව ආවෙ නෑ. ඒවගේම අදත් මේ සම්බන්ධයෙන් 130 දෙනෙක් අත්සන් කරල ලිපියක් ලැබිල තියෙනවා. ඒ අය කැමැත්ත ප්‍රකාශ කරල තියෙනවා. මට දැනගන්න ලැබුන තාප්පෙ තිබුනට වඩා අඩි දෙක තුනක් ඉස්සරහට කරලයි කියල බඳින්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,</u>**

මම මේ විහාරය ගැන ඉතිහාසය දන්නව. 1991 - 1997 කාලෙදි අපි සෞඛ්‍ය සතියට තාප්පෙ බදින කොට අඩි 12 ක පාරක් ගත්තා. මම තමයි එදා වට මනින්න උදව් කරේ. එහකොට රෝහල් භූමියේ තිබුන ළිඳ කඩන්න බැරි නිසා ළිඳත් වටකරල තමයි තාප්පෙ බැන්දෙ. ඒවෙලාවෙ ඕකන්දෙ ගම්වාසීන් ඉල්ලුව ඕකන්දට එන්න බැහැයි කියල මේ පාරෙන්. ඒවෙලාවෙ අඩි 12 ක පාරක් බැකෝ කරල එතෙන්ට සම්බන්ධ කරා. ඒ පාරෙන් අඩි 6 ක් මේ තාප්පෙ බදිනවා. දැන් අපේ සුසාන භූමියෙන් අඩි 6 ක් තමයි අල්ලල තියෙන්නෙ. දැන් අත්තිවාරම දාල. අපි සභාවෙන් මේ ඉඩම් ප්‍රමාණය එක්කො පන්සලට පරිත්‍යාග කරන්න ඕනෙ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

පරිත්‍යාගයක් නම් පරිත්‍යාගයක් වෙන්න ඕනෙ. බලෙන් අල්ලගෙන පරිත්‍යාග කරන්න බැහැනෙ.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මේකෙදි ගම දෙකට බෙදිල තියෙන්නෙ. ප්‍රධාන දායකයො විදියට මටත් රාහුල මන්ත්‍රීතුමාටත් මේ ප්‍රශ්නය සෑහෙන බලපානව. සභාව මැදිහත්වෙලා මේක නිරාකරණය කරන්න කියල තමයි ඉල්ලා සිටින්නෙ.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේක විශාල ප්‍රශ්නයක්. පුණ්‍ය ආයතනයක් විසින් බලහත්කාරයෙන් නගර සභාවෙ ඉඩම අල්ලගැනීම.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මේක ඇත්තටම මටත් ප්‍රශ්නයක්. මෙතන ඇත්තටම වරද තියෙන්නෙ හාමුදුරුවන්ගෙ අතේ. මේක කරන්න තිබුණෙ සභාවෙන් අවසරයක් අරගෙන. මෙතනදි හාමුදුරුවන්ගෙ ක්‍රියා කලාපය තුල ගම දෙකට බෙදීමක් තමයි වෙලා තියෙන්නෙ. මම හිතන්නෙ තිබුණ විදියට බදින එක තමයි සුදුසු.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේක සාමාන්‍ය කෙනෙක් කරානම් නීති මගින් කටයුතු කරල. මේක රාහුල මන්ත්‍රීතුමත් ජනිත් මන්ත්‍රීතුමත් එකතු වෙලා නිරාකරණය කරන්න බලන්න.

**තීරණය**

මේ සම්බන්ධයෙන් නිලධාරීන්ගේ වාර්තාව අනුව කටයුතු කිරීමට සභාව තීරණය කරන ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂමී හේමන්තා ද සිල්වා මෙනවිය කථා කරමින්,**

සභාපතිතුමනි හීන් ඇල පාරෙ ඉඳල දුම්රිය මාර්ගයට යන අතුරු පාරෙ අය මට ලිපියක් ඉදිරිපත් කරා ඒ පාර හදන්න කියලා.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

ඒකෙ පැවරුම් නියෝග ඉදිරිපත් කරන්න මන්ත්‍රීතුමිය.

**<u>තීරණය</u>**

අදාල මාර්ගය පවරාගෙන සංවර්ධනය කිරීමටත් අදාල පැවරුම් නියෝග සභාවට ඉදිරිපත් කිරීමටත් සභාව තීරණය කරන ලදී.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඒවගේම එඬේරමුල්ල පාරත් මොකක්හරි කරන්න. අපිට තව ටික කාලයයි තියෙන්නෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මන්ත්‍රීතුමිය ඒකෙ 44 වන වගන්තියේ නියෝගය නෑ. දිසාපතිතුමා ලියාපදිංචි කරන්න ඕනෙ මේක නගර සභාව සතු ඉඩමක් කියලා. ඊට පස්සෙ තමයි අපට උසාවියට යන්න බලයක් තියෙන්නෙ. ඒ නිසා නඩු පවරන්න විදියක් නෑ. ඔබතුමියට පුලුවන් අදාල 21 දෙනෙක් ඉන්නව පාර අල්ලගත්ත අය. ඒ 21 දෙනාට කියන්න තමන්ගෙ තාප්ප පස්සට ගන්න කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කථා කරමින්,</u>**

සභාපතිතුමනි සමහර අය කැමති වෙන්නෙ නැහැනෙ. එක්කෙනෙක්ගෙ ප්‍රශ්නයක් වෙනුවෙන් සියලු අය අපහසුතාවයට පත් වෙනවා. ඡන්දයක් නම් ඉල්ලන්න බැහැ ඒ පැත්තෙන් සභාපතිතුමා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

එහෙම නම් එක්සත් ජාතික පක්ෂයට තමයි යන්න බැරි වෙන්න ඕනෙ. එක්සත් ජාතික පක්ෂයේ කෙනෙකුගෙ තමයි ගේ කැඩෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඒ අය තාප්පයක් බැන්ද අනවසර. ඒකට මොකද කරේ. අද වෙනතුරු නගර සභාව ගත්ත පියවර මොකක්ද? හැමෝටම එක නීතිය වෙන්න ඕනෙ සභාපතිතුමා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මම ඒක සොයල බලන්නම්.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මම නැති වෙලාවෙ පාලම සම්බන්ධව ප්‍රශ්නයක් ඇහුවද?

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ලංකාදීප පත්තරේ දාල තිබුන අම්බලන්ගොඩ පාලමේ විදුලිය නැහැ. ඔබතුමාගෙන් විමසුවහම ඔබතුමා කියල තිබුණ අපිට අයිති නැහැයි කියලා. රත්ගමින් ඇහුවහම ඒ අය කියල තිබුණ අපි කරන්නම් කියලා. අපි ඔය පාලම

හදල ඉවර වුනහම නගර සභාවෙන් තිරණය කරා විදුලිය දෙන්න ඕනෙ කියලා. මේක පරක්කු වුනේ අපි ළග දිග ඉනිමගක් තිබුනෙ නැහැ. මම ඔබතුමාට දැනුත් යෝජනා කරන්නෙ අපි කොහොම හරි මේක කරමු කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මම ලයිට් දාන්න ඕනෙයි කියන එකට ඔබතුමා එක්ක එකගයි. මම මේ සභාවට එන්න ඉස්සෙල්ල ඔය පාලම සම්බන්ධයෙන් අම්බලන්ගොඩ නගර සභාවත් හික්කඩුව ප්‍රාදේශීය සභාවත් නඩුවක් කිව්ව. නඩුවෙ තීන්දුව හම්බ වුනේ අනික් පැත්තට. සභාව පරාදයි. ඒ නිසා අයිති නැහැයි කියන එකනම් දන්නව. නමුත් විය යුතුයි කියන දේදි මම ඔබතුමා එක්ක ඉන්නවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඇනිකට් එක අපේ. එතන ටර්නින් පොයින්ට් එකක් ගහල තියෙනවා. ඔතන අම්බලම තිබුන. එතන කෙසෙල් ගස් යට බෝඩ් එක තිබුණ. ඔබතුමා කිව්වට නඩුවක් ගියයි කියල මම කියනව එහෙම එකක් නෑ කියලා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අනිත් එක මනීෂා රණසිංහ, ආරියසේන රණසිංහ යන අයට ලිපියක් යවල තියෙනවා කාණුව සකස් කරන්න කියලා. ඒ මහත්මය කිව්ව මේකෙ නඩුවක් තියෙනව කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

සභාව ගත්ත තීන්දුවක් අනුව තමයි නඩු පැවරීම කරේ. නඩු පවරන්න කියල මන්ත්‍රීවරුන් සියලු දෙනා එකග වුනා. නඩු පැවරීමේදී ඒ කොටස සඳහන් වෙලා තියෙන්නෙ වැරදි ආකාරයට. නිවැරදි කරන්න තමයි ඕක යවල තියෙන්නෙ. පී. එම්. එස්. මහත්තය 1991 දීල තියෙනව නියෝගයක්. ඒ නියෝගය අනුව තමයි මමත් කටයුතු කරන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මහාවිදිය ඩයමන් ඔරලෝසු කඩය ලගින් යන කාණුව මේ වන විට මාස කිහිපයක්ම සුද්ධ කරල නෑ. ඒ ප්‍රදේශය දැඩි ඩෙංගු අවදානමට ලක් වෙච්ච ප්‍රදේශයක්. ඒ නිසා මම ඉල්ලා සිටිනවා සතියකට වරක්වත් ඒ කාණු සුද්ධ කරන්න කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

ලේකම්තුමා මේක සුද්ධ කරන්න කියන්න. මේ කාණුව වරාය ඉදි වීම නිසා වෙනත් පැත්තකට මාරු කරපු කාණුවක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි දලුක්කන්දෙ ඉදිකරපු පොහොර ගබඩාවෙ වහල ගැලවිලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

අපි ඒක ගලවගෙන ආව.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඒවගේම අශෝක උයනෙ පිට්ටනිය අසල ප්‍රදේශයේ ලයිට් කණුවල ලයිට් නැහැ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

වැඩ අධිකාරී මහතා ඒක බලල අවශ්‍ය කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි සභාවෙ දුරකථන වලට CLI පහසුකම් ලබා ගැනිම සිදු කරාද? ඉන්ටර්කොම් පහසුකම් ලබා ගත්තද?

**ප. ව. 12.40 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

ඩී. වී. සුනිල්,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2013 – 09 – 12 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**